







# ශිෂ්‍ය අත්පොත 2023

## විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය

## ශිෂ්‍ය අත්පොත 2023

**විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය - ශිෂ්‍ය අත්පොත**

**ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය**

**කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

ISSN 3021-6508
හිමිකම © 2023
සියලුම හිමිකම් ඇවිරිණි

**කතෘ මණ්ඩලය**
මහාචාර්ය ජී.ඩී.වී.ආර්.සේනාධීර මහත්මිය
ආචාර්ය කේ.ඒ.එස්.කේ.කාරියප්පෙරුම මහත්මිය

**සහාය කතෘ මණ්ඩලය**
ටී.පී.ජී.සී. අල්විස් මෙනෙවිය
වී.එච්. සමරසිංහ මහත්මිය
ඒ.කේ.කේ.ආර්. ජයතිලක මෙනෙවිය
එම්.ටී.එස්. පෙරේරා මහතා

**සැලසුම් සහ පිරිසැලසුම්**
එම්.ටී.එස්. පෙරේරා මහතා

**විමසීම්**

**අධ්‍යයනාංශ ප්‍රධාන**
ව්‍යාපර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ, 10250, ශ්‍රී ලංකාව.
**දුරකතන:** +94 (0)112-803472
**Web:** https://mgt.sjp.ac.lk/bus/
**Email:** busadmin@sjp.ac.lk

**සහකාර/නියෝජ්‍ය ලේඛකාධිකාරි**
බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ, 10250, ශ්‍රී ලංකාව.
**දුරකතන:** +94 (0)112-801481
**Web:** http://external.sjp.ac.lk/
**Email:** externalexam@sjp.ac.lk


**පූර්ව දැනුම්දීමකින් තොරව මෙහි දක්වා ඇති ඕනෑම තොරතුරක් සුදුසු යැයි සලකන පරිදි වෙනස් කිරීමට ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයට සහ බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත තනි බලය ඇත.**

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ගීතය
## Anthem of University of Sri Jayewardenepura

ශ්‍රී ලංකා පින්බර රන් දෙරණේ
ශ්‍රී නිවාස වූ මහ අගනගරේ
ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ
ශ්‍රී නාමය රඳවවු ලෝ මුදුනේ

භික්ඛුවේ සිරි සුමගල් සමිඳුන්
වැලිවිටියේ සෝරත බඳු යතිඳුන්
බිහිකළ විද්‍යෝදය විදු බිම දුන්
එළියෙන් - දිවි මග සරසවු

අයුක්තියේ දී විවාදශීලී
අසත්‍යයේ දී විචාරශීලී
වියත් සබා මැද සමාජශීලී
වියතුන් වී දැය පොබයවු
විජ්ජා උප්පතතං සෙට්ඨා..//



**ගේය පද රචනය**
සේවාර්පිත මහාචාර්ය සුනිල් ආරියරත්න

**තනු නිර්මාණය සහ සංගීතය**
ආචාර්ය රෝහණ වීරසිංහ

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දැක්ම**

*විජ්ජා උප්පතතං සෙට්ඨා ("උපන්නා වූ සියලු දේ අතුරින් දැනුම ශ්‍රේෂ්ඨ වේ") යන ශික්ෂාව මත ප්‍රතිෂ්ඨාපිත අධ්‍යාපනය තුළින් ජීවිත සෞභාග්‍ය කරා ගමන් කරවීම.*

**කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨයේ දැක්ම**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දැක්ම වන අධ්‍යාපනය තුළින් සෞභාග්‍යය කරා යොමු වීම සඳහා කළමනාකරණ අධ්‍යාපනය තුළින් ජීවිත සෞභාග්‍යය කරා ප්‍රවර්ධනය කිරීම හා ස්ථාපිත කිරීමයි.

*මෙහෙවර ප්‍රකාශය*

කළමනාකරණ අධ්‍යාපනය, පර්යේෂණ සහ නව්‍යතාවයන් තුළින් සමාජයට සහ ලෝකයට ධනාත්මක දායකත්වයක් කළ හැකි අගනාවන් මත පදනම් වූ වෘත්තිකයන් සහ නායකයන් නිර්මාණය කිරීම.

***විශ්වවිද්‍යාලයේ දැක්ම හා ගැලපෙන පහත සඳහන් ප්‍රධාන හරඅගනාවන් පහ ඇතුළත් වන දැක්ම කරා ගමන් කරවීමට කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය කැප වී සිටී.***

### *ප්‍රඥාව (Wisdom):*

චර්යාව තුළ ප්‍රඥාවන්ත වෙමින් යහපත් තීරණ ගැනීමට සහ යහපත් තීන්දු ක්‍රියාවේ යෙදවීමට දැනුම සහ පළපුරුද්ද විශිෂ්ට ලෙස භාවිතා කිරීම දිරිගැන්වීම.

### *විශිෂ්ටත්වය (Excellence):*

ඉහළම ප්‍රමිති අත්කර ගැනීමට සහ අපේක්ෂාවන්ට වඩා ඉහළ ප්‍රතිඵල ලබාදීමට කැප වූ සංස්කෘතියක් පෝෂණය කිරීම.

### *සදාචාරය (Morality):*

බුද්ධිය, ප්‍රතිභාව, අධිෂ්ඨානය සහ හරය විසින් විචක්ෂණ චර්යාවන් ගොඩ නගමින් ආචාර ධර්ම සහ සදාචාරාත්මක වටිනාකම් ඇතුළත් කිරීම.

### *විවිධත්වය (Diversity):*

සමානතාව බලපවත්වන සහ අන්‍යයන්ට ගරුකරන ඇඩි සහ විනයානුකූල හැසිරීම සහතික කරමින් විවිධ ස්වරයන්ට සහ බහුවිධ දෘෂ්ටිකෝණවලට පහසුකම් ඇති කිරීම.

### *සාමූහිකත්වය (Collegiality):*

සම්මුතීන්, බලය බෙදා හැරීම, උපදේශනය සහ සාමූහික වගකීම් අවධාරණය කරමින් අන්‍යෝන්‍ය වශයෙන් ගරු කරන විද්වත් ප්‍රජාව පෝෂණය කිරීම.

## පටුන


| | | |
|---|---|---|
| | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාගේ පණිවිඩය | 01 |
| | කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨයේ පීඨාධිපතිතුමාගේ පණිවිඩය | 02 |
| | ගරු අධ්‍යක්ෂක ස්වාමීන් වහන්සේගේ පණිවිඩය | 03 |
| | ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධානතුමියගේ පණිවිඩය | 04 |
| | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීතුමාගේ පණිවිඩය | 05 |
| | හැඳින්වීම - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 06 |
| | හැඳින්වීම - කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය | 07 |
| 1 | හැඳින්වීම - ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | 08 |
| 2 | උපාධි පාඨමාලාවේ අරමුණු | 08 |
| 3 | උපාධි පාඨමාලාවේ අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල | 09 |
| 4 | සාර්ථක උපාධිධාරියෙකු : විස්තරය (Graduate Profile) | 09 |
| 5 | යෝග්‍යතා නිර්ණායක | 09 |
| 6 | සිසුන් බඳවා ගැනීම | 10 |
| 7 | උපාධි පාඨමාලාවේ ව්‍යුහය | 10 |
| 8 | උපාධි පාඨමාලාවේ විෂයමාලා ව්‍යුහය | 10 |
| 8.1 | උපාධි පාඨමාලාවේ විෂයමාලා ව්‍යුහය | 11 |
| 8.2 | උපාධි පාඨමාලාවේ අධ්‍යාපනික ප්‍රවේශය සහ අධ්‍යයන වාර ව්‍යුහය | 12 |
| 9 | උපාධි පාඨමාලාවේ කාලසීමාව | 12 |
| 10 | උපාධි පාඨමාලාවේ මාධ්‍යය | 12 |
| 11 | උපාධි පාඨමාලාවේ ගාස්තුව | 12 |
| 12 | සිසුන්ගේ කාර්යසාධනය ඇගයීම සහ ශ්‍රේණිගතකරණ ක්‍රමවේදය | 13 |
| 12.1 | ශ්‍රේණිගතකරණ පරිමාණ | 13 |
| 12.2 | ශ්‍රේණි ලකුණුවල සාමාන්‍ය ගණනය කිරීම සඳහා මාර්ගෝපදේශ | 13 |
| 12.3 | අවසන් අධ්‍යයන වාර විභාගය සහ අඛණ්ඩ ඇගයීම | 14 |
| 12.4 | පාඨමාලා සඳහා අවසන් ලකුණු ගණනය කිරීම සඳහා මාර්ගෝපදේශ | 14 |
| 12.5 | පාඨමාලාවක් සමත්වීම හෝ අසමත්වීම | 15 |
| 12.6 | විභාගයකට නොපැමිණ සිටීම සඳහා වලංගු හේතු | 16 |
| 12.7 | වෛද්‍ය හේතු මත ඉවත්වීම | 16 |
| 12.8 | පාඨමාලාවක් නැවත කිරීම | 16 |
| 12.9 | පාඨමාලාවක අවසන් අධ්‍යයන වාර විභාගය නැවත කිරීම | 17 |
| 12.10 | අවසන් අධ්‍යයන වාර විභාගය සඳහා නොපැමිණි අය | 17 |
| 13.1 | උපාධි පාඨමාලාව සමත්වීම | 17 |
| 13.2 | අධ්‍යයන වාර විභාගවල අසමත් විෂයයන් සමත්වීම | 18 |

| | | |
|---|---|---|
| 13.3 | උපාධිය සම්පූර්ණ කිරීම - උපාධිය සඳහා අවශ්‍යතා | 18 |
| 14 | පන්ති පිරිනැමීම | 18 |
| 15 | උපාධියේ වලංගු දිනය | 19 |
| 16 | ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාරය | 19 |
| | ඇමුණුම<br>පාඨමාලාවේ විස්තර | 21 |

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාගේ පණිවිඩය




වසර 60කට අධික ඉතිහාසයකට උරුමකම් කියනු ලබන දකුණු ආසියාවේ විශිෂ්ටතම කළමනාකරණ අධ්‍යයන පීඨය ලෙස ගෞරවය දිනා ගත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සඳහා බාහිර උපාධි අපේක්ෂකයෙකු වශයෙන් ඇතුළත් වන ඔබට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස පළමුවෙන් මාගේ සුභාශිංසන එක් කරනු කැමැත්තෙමි.

සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ඔබගේ ජීවිතයේ වැදගත්ම අධ්‍යාපනික කඩඉම ජය ගැනීමට තෝරා ගැනීම සම්බන්ධයෙන් ඔබ සැබැවින්ම ආඩම්බර විය යුතුය. රාජ්‍ය විශ්වවිද්‍යාල අතරින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඉදිරියෙන්ම සිටිනුයේ වර්තමානයේ පවතින තරඟකාරී අධ්‍යාපන ක්‍රමය තුල විශිෂ්ට ජයග්‍රහණ ලබමින් තම පැවැත්ම අඛණ්ඩව පවත්වා ගැනීම හේතුවෙනි. පරිපූර්ණ දැනුමින් අනූන බුද්ධිමතුන් බිහි කරනු වස් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සිය වගකීම නොපිරිහෙලා ඉටු කරනු ඇත. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය නිරන්තරයෙන් උත්සාහ දරනුයේ වර්තමාන ලෝකයේ තරඟකාරී රැකියා වෙළඳපොලට ගැලපෙන අයුරින් ඉලක්ක ජය ගත හැකි උපාධිධාරීන් දැයට බිහි කිරීමටයි. එත්මන් කළමනාකරණ ක්ෂේත්‍රය තුල විවිධ අංශ නියෝජනය කිරීම සඳහා ඕනෑම අභියෝගයක් ජය ගත හැකි ඉහළ ආත්ම විශ්වාසයකින් හා දැනුමින් පරිපූර්ණ බුද්ධිමතුන් බිහි කිරීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ප්‍රමුඛතම අරමුණක් වන අතර පීඨය මගින් පිරිනමන වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධිය සහ විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය යන උපාධි ත්‍රිත්වය හැදෑරීමේ මහඟු අවස්ථාව ඔබට හිමිවේ.


තම සිහිනය සැබෑ කරගනිමින් උපාධිධාරියෙකු ලෙස බිහිවීම ඔබට සැබැවින්ම අභියෝගාත්මක කටයුත්තක් වුවද එම භාරදූර කටයුත්ත ඉටු කිරීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය විසින් වගකීමෙන් කටයුතු කරනු ඇත. ආචාර්ය, මහාචාර්යවරුන්ගෙන් සැදුම්ලත් ප්‍රවීණ දේශක මණ්ඩලය මෙන්ම සුහදශීලී කාර්ය මණ්ඩලයද ඔබේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් අවශ්‍ය නොමඳ සහයෝගය සහ මඟපෙන්වීම ලබා දෙනු ඇත.

විශිෂ්ටත්වය කරා යන ගමනේදී ගුණාත්මකභාවය ඉතා වැදගත් කොට සැළකිය යුත්තකි. ඉහළ ප්‍රමිතිගත දැනුමින් යුතු උපාධිධාරියෙක්, සමාජයට වඩාත් වැඩදායී ගුණාත්මකභාවයෙන් යුතු විනයගරුක පුද්ගලයෙක් වීමද අනිවාර්ය වේ. මේ සඳහා අවශ්‍ය මානසික දියුණුව මෙන්ම තම කුලසතාවයන් වර්ධනය සඳහාද විශ්වවිද්‍යාලය තුල ඔබට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව හිමිවනු ඇත.

විශිෂ්ට උපාධිධාරියෙක් ලෙස බිහිව ජීවිතයේ සියළු අභියෝග ජය ගැනීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි මාගේ සුභාශිංසන එක් කරනු ලබන අතර ඔබ ලබා ගත් දැනුම සහ අත්දැකීම් තුලින් යම් දිනෙක ඉහළ ඵලදායීත්වයකින් යුතුව රටෙහි සංවර්ධනයට දායක වනු ඇතැයි බලාපොරොත්තු වන්නෙමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පත්මලාල්
උපකුලපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## පීඨාධිපතිතුමාගේ පණිවිඩය - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය



කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන බාහිර උපාධි පාඨමාලා ශිෂ්‍ය අත්පොතෙහි මෙම පණිවිඩය ප්‍රකාශයට පත් කිරීමට ලැබීම පිළිබඳව මා අතිශයින් සතුටට පත්වෙමි. මෙරට පුරෝගාමී කළමනාකරණ පීඨය වන කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියට සහ ජාතියට කළමනාකරණ අධ්‍යාපනය හඳුන්වා දීම සම්බන්ධයෙන් ආඩම්බර වන අතර එම නිසා ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ඨතා මධ්‍යස්ථානය ලෙස නම දිනා ගෙන ඇත. උසස් පෙළ විභාගයෙන් පසු කළමනාකරණ විෂය ක්ෂේත්‍රයෙහි උසස් අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂා කරන සිසුන්ගේ පළමු සහ ප්‍රමුඛතම තේරීමද අපගේ පීඨයයි. එසේ වුවද, අභ්‍යන්තර ශිෂ්‍ය බඳවා ගැනීම් ප්‍රමාණය සීමා සහිත වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කළමනාකරණ පීඨයේ අධයාපනය හැදෑරීමේ සිහිනය සැබෑ කර ගැනීමට වාසනාවන්ත වන්නේ සිසුන් සුළු පිරිසක් පමණි.

කෙසේ වෙතත්, සීමිත අවස්ථා හේතුවෙන් අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස උසස් අධ්‍යාපනය හැදෑරීමට නොහැකි වූ ඔබට, සුදුසුකම්ලත් කළමනාකරණ උපාධිධාරියෙකු වීමේ සිහිනය සැබෑ කර ගනිමින්, පිළිගත් උපාධියක් ලබා ගැනීම සඳහා අවස්තාව කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය විසින් ඔබට විවෘත කර දී ඇත. අපගේ බාහිර උපාධි පාඨමාලා වාණිජ විෂය ධාරාවෙන් උසස් පෙළ හැදෑරූ සිසුන්ට පමණක් නොව ජීව විද්‍යාව, ගණිතය, කලා වැනි අනෙකුත් විෂය ධාරාවන්හි සිසුන් සඳහා ද විවෘතය. එපමණක් නොව, ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල අතරින් කළමනාකරණ අධ්‍යයන ක්ෂේත්‍රයේ ඉහළම සුදුසුකම් ඇති හොඳම අධ්‍යයන කාර්යමණ්ඩලයෙන් අපගේ පීඨය සමන්විත වන අතර ඔවුන්ගෙන් දැනුම ලබා ගැනීමට සිසුන් වශයෙන් ඔබ වාසනාවන්ත බව ඉමහත් සතුටින් සඳහන් කිරීමට කැමැත්තෙමි. වසර 60 කට අධික කාලයක් කළමනාකරණ ක්ෂේත්‍රයේ විෂය දැනුම හා ප්‍රඥත්වය උත්පාදනය කරමින් රටට අසමසම සේවාවක් කළ මෙම කීර්තිමත් පීඨයෙන් සාර්ථකව උසස් අධ්‍යාපනය නිමකර කුසලතාපූර්ණ උපාධිධාරියෙකු ලෙසින් නික්ම යෑමට ඔබට හැකිවේවා යන්න මාගේ අවංක ප්‍රාර්ථනාවයි. එබැවින් මෙම පීඨයේ අනාගත උපාධිධාරියෙකු ලෙස, මේ රටේ ජනතාවගේ ජීවිත නගා සිටුවීමේ වගකීම ඔබ විසින් ඉටු කරනු ඇතැයි මම අවංකවම විශ්වාස කරන අතර ඒ සඳහා ඔබට ශක්තිය හා ධෛර්යය ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය දුෂාන් ජයවික්‍රම
පීඨාධිපති
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය

## ගරු අධ්‍යක්ෂක ස්වාමීන් වහන්සේගේ පණිවිඩය



අති ගෞරවාර්හ හික්කඩුවේ ශ්‍රී සුමංගල සහ වැලිවිටියේ ශ්‍රී සෝරත යතිවරයාණන් වහන්සේලාගේ උරුමය අඛණ්ඩව ඉදිරියට රැගෙන යන ශ්‍රී ලංකාවේ පුරෝගාමී විශ්වවිද්‍යාලයක් වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවක වශයෙන් තේරී පත් වූ ඔබ පළමුව බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙනුවෙන් සාදරයෙන් පිළිගැනීමට කැමැත්තෙමි.

ව්‍යාපාර අධ්‍යයන ක්ෂේත්‍රය හා සම්බන්ධ නිපුනත්වයෙන් සපිරි විද්වතුන් අවැසි සමයක, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය මගින් ඉදිරිපත් කරන ලබන එක් විශිෂ්ට උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා ඔබට අවකාශ ලැබීම සැබවින්ම වාසනාවකි. මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව **"අධ්‍යාපනය තුළින් සෞභාග්‍ය කරා"** නම් වූ විශ්වවිද්‍යාලයේ දැක්මට අනුගතව මෙහෙයවන ලද විද්‍යාර්ථීන් වශයෙන් ඉහළ ගුණාත්මක බවකින් යුතුව තීරණ ගන්නා ව්‍යවසායකයන් බවට පත් වී ජාතික සංවර්ධනය උදෙසා ඵලදායී මෙහෙවරක් ඉටු කිරීමට ඔබට හැකි වනු ඇති බව මාගේ විශ්වාසයයි.

ඔබගේ උපාධි පාඨමාලාව මුල සිට අවසානය දක්වාම පවත්වාගෙන යාමට සහාය වන කළමනාකරණ හා පරිපාලන ඒකකය වශයෙන් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය අංශ තුනක් කෙරෙහි විශේෂ අවධානයකින් කටයුතු කරනු ලැබේ. එනම් වර්තමාන වෙළඳපල ඉල්ලුමට සරිලන පරිදි උපාධි පාඨමාලා නියමානුකූල කිරීම, නිශ්චිත කාල සීමාවක් තුළ උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා සිසුන්ට සහාය වන ක්‍රියාවලිය කඩිනම් කිරීම සහ මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සිදු කරන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සහ ඇගයීම් සම්බන්ධ යහපුරුදුවලට අනුගත වීම ආදී වශයෙනි. මෙකී ත්‍රිවිධ පරිශ්‍රමයන්හි ආශිර්වාදය මතින්, ඉදිරි වසර තුන තුළ භෞතික වශයෙන් හා මාර්ගගතව පවත්වනු ලබන දේශන, මනා අත්දැකීම් සහිත දේශකවරුන්ගේ පටිගත කළ දේශන සහ වෙනත් අධ්‍යයන පහසුකම් සේම ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය ආශ්‍රිත පහසුකම් ආදී බොහෝ දේ ඔබට ලබා ගැනීමට හැකි වනු ඇත.

එබැවින් ජාත්‍යන්තර මට්ටමින් පිළිගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් ඉහළ පිළිගැනීමක් සහිත උපාධියක් අවම පිරිවැයක් දරා ලබා ගැනීමට ලද මෙම මහඟු අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ලෙස මම ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඔබගේ සියලු කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා!

තෙරුවන් සරණයි!

**මහාචාර්ය පූජ්‍ය පින්නවල සංඝසුමන හිමි**
**අධ්‍යක්ෂක**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**

## අධ්‍යයනාංශ ප්‍රධානතුමියගේ පණිවිඩය - ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය



විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි වැඩසටහනේ ශිෂ්‍ය අත්පොත වෙත මෙම පණිවිඩය යැවීමට ලැබීම සතුටට කරුණකි. පළමුව, වසර තුනක කාලයක් මෙම කීර්තිමත් අධ්‍යයනාංශයේ උසස් අධ්‍යාපනය හැදෑරීමට ඔබට ලැබී ඇති මෙම මහඟු අවස්ථාවෙහි වටිනාකම සලකා බලා ඔබව මුළු හදවතින්ම පිළිගන්නට කැමැත්තෙමි. ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පුරෝගාමී අධ්‍යයනාංශයකි. එය 1980 ගණන්වල පිහිටුවන ලද අතර වර්තමානයේ දී විශ්වවිද්‍යාලයේ වඩාත්ම කීර්තිමත් හා කැපී පෙනෙන අධ්‍යයනාංශයක් ලෙස මතුවෙමින් පවතී.

බාහිර උපාධි වැඩසටහනක උපාධි අපේක්ෂකයෙකු ලෙස, පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගනිමින්, පාඨමාලා වැඩ නිම කිරීම සහ හොඳ වටිනාකම් සහ භාවිතයන් ප්‍රවර්ධනය කරමින් දැවැන්ත කැපවීමකින් වැඩ කිරීමට ඔබට සිදු වනු ඇත. ඉලක්ක සපුරා ගැනීමේදී ඔබට මඟ පෙන්වීමට සහ සහාය වීමට හැකි ඉහළම සුදුසුකම්ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් අප සතුව සිටීම ඔබ ලබන මහඟු භාග්‍යයකි. අනාගතයේ දී සෑම පුද්ගලික සහ සමාජීය තීරණයක් සමඟම කටයුතු කිරීමේදී තීරණාත්මක වන ඔබේ ශාස්ත්‍රීය පෞරුෂය ගොඩනැගීමට ඔවුන් උපකාර කරනු ඇත. මෙම අධ්‍යයනාංශයෙහි මූලික පරමාර්ථය වන්නේ ඔබ උසස් තත්ත්වයේ නායකයෙකු ලෙස අවංකභාවය සහ ආත්ම අභිමානය පිළිබඳ හැඟීමක් ඇති කළමනාකරුවෙකු ලෙස නිර්මාණය කිරීමයි. ඔබ ප්‍රයෝජනවත් ශ්‍රී ලාංකික පුරවැසියෙකු වනු ඇතැයි මම අපේක්ෂා කරමි.

අද දින අනාගතය ජය ගැනීම සඳහා වැදගත් පියවරක් තබන ඔබ සැමට මාගේ හදපිරි සුභාශිංසනය පිරිනමමි.

**ආචාර්ය කේ.ඒ.එස්.කේ. කාරියප්පෙරුම**
**අධ්‍යයනාංශ ප්‍රධාන**
**ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය**
**කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

## ලේඛකාධිකාරීතුමාගේ පණිවිඩය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



2023 වසර සඳහා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගන්නා නවක උපාධි අපේක්ෂකන් වෙනුවෙන් සකස් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා විවරණිකාව වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

දිවයිනේ ප්‍රමුඛ පෙළේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට බාහිර උපාධි අපේක්ෂකයෙකු ලෙස ලියාපදිංචි වී උසස් අධයාපනය හැදෑරීමට ඔබ විසින් ගනු ලැබු බුද්ධිමත් තීරණය මා සමස්ථ පරිපාලනය වෙනුවෙන් අගය කරමි. එය අප දකිනුයේ අප විශ්වවිද්‍යාලයේ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධ්‍යයන වැඩසටහන් සහ විශිෂ්ඨ කළමනාකරණය කෙරෙහි ඔබ තැබු විශ්වාසයක් ලෙසිනි.

ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචියේ සිට උපාධි සහතිකය ලබා ගැනීම දක්වා සමස්ථ ක්‍රියාවලිය තුල නවීන තාක්ෂණය භාවිතා කරමින් කඩිනම් හා සුහදශීලී සේවයක් ලබා දීමට සමස්ථ කාර්යය මණ්ඩලයම කැපවී සිටින බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ඔබ උපාධිය හදාරන කාලය තුළ ඔබට යම් පරිපාලනමය කාර්යයක් ඉටු කර ගැනීමට සිදුවුවහොත් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර ලේඛකාධිකාරි, නියෝජ්‍ය ලේඛකාධිකාරි, අධ්‍යක්ෂ හෝ ලේඛකාධිකාරීවරයා හමු වී එය කඩිනමින් නිරාකරණය කර ගැනීමේ හැකියාවක් ඇති බව දන්වනු කැමැත්තෙමි.

ඒ.බී. වැලිවිට
ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

1883 දී පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි විසින් පිහිටුවන ලද මාළිගාකන්ද විද්‍යෝදය පිරිවෙන, 1959 දී 1958 අංක 45 දරන විශ්වවිද්‍යාල පනත යටතේ සීලෝන් විශ්වවිද්‍යාලය ලෙස පිහිටුවන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ලෙස මෙම නම වෙනස් කරන ලද්දේ ශ්‍රී ලංකාවේ පරිපාලන අගනුවර බවට ශ්‍රී ජයවර්ධනපුර නගරය නම් කෙරුණු පසුවය. විශ්වවිද්‍යාලය වර්තමානයේ ගංගොඩවිල නුගේගොඩහි ස්ථාපිතව ඇත. මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි පීඨ 11 ක් ඇති අතර එය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ විශාලතම විශ්වවිද්‍යාලය බවට පත් වීමට ඇති හේතු වී ඇත. විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණ වන්නේ ඉගැන්වීමම් සහ පර්යේෂණ කටයුතු තුලින් වටිනා ශ්‍රී ලාංකික පුරවැසියෙකු බිහි කිරීමයි. අද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල අතරින් ප්‍රමුඛ විශ්වවිද්‍යාලයක් බවට පත් වන්නේ දැනුම, නිර්මාණය හා ද්‍රව්‍යමය වශයෙන් හා අධ්‍යාත්මික වශයෙන් පෝෂණය වූ පරිපූර්ණ පුද්ගලයෙකු බිහි කිරිමේ හැකියාව නිසාවෙනි.



# කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය යනු කළමනාකරණ ක්ෂේත්‍රයේ වසර 60 කට වැඩි කාලයක ආඩම්බර ඉතිහාසයක් හිමි කළමනාකරණ ක්ෂේත්‍රයේ පුරෝගාමී පීඨයකි. ඇගේ ජයග්‍රාහී ඉතිහාසය තුළ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සිසුන් 50,000 කට වැඩි පිරිසකට සාර්ථකත්වයට මඟ පෙන්වනු ලැබීය. යාවත්කාලීන වැඩසටහන් තුළින් ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා දැක්වූ දායකත්වය නිසා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනයේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය ලෙස සැලකේ. උසස් තත්ත්වයේ බුද්ධිමය නිර්මාණයෙහිලා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ දායකත්වය අතිමහත්ය. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ උපාධිධාරියෙකු ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ සුදුසුකම් ලබන්නෙක් පමණක් නොව ප්‍රායෝගික දැනුම සහ ඉහළ සම්මුතීන් සහිත පුද්ගලයෙකු වේ. උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාලය දේශීය හා ජාත්‍යන්තර වශයෙන් කාර්මික, වාණිජ හා ශාස්ත්‍රීය ආයතන සමඟ සමීපව බැඳී සිටී. අපගේ සිසුන් අධ්‍යයනාංශ/උපාධි පාඨමාලා 12 ක විෂයයන් 60 කට වඩා වැඩි ප්‍රමාණයකට නිරාවරණය වේ. අනෙක් අතට නව්‍ය හා බුද්ධිමය උත්තේජනය වැඩි දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කරනු ලබේ. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය එලෙසින්ම සන්නිවේදන කුසලතා, කණ්ඩායම් කුසලතා, නායකත්ව කුසලතා සහ මෘදු කුසලතා වැනි වටිනා කුසලතා වැඩි දියුණු කිරීමට පහසුකම් සපයයි.



**විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි වැඩසටහන**

ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය

කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## 1. හැඳින්වීම

ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනය තුළ පුරෝගාමියා වේ. 1980 වර්ෂයේ දී එහි පිහිටුවීමේ සිට, මෙම දෙපාර්තමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ විශාලතම අධ්‍යාපනික අධ්‍යයනාංශය ලෙස පවතී.

මෙම අධ්‍යයනාංශය ගෝලීය වශයෙන් තරඟකාරී වසර හතරක විශේෂ උපාධියක් වන විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය සහ වසර තුනක විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධියක් පිරිනමනු ලැබේ. විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධියේ විෂයමාලාව සමාජය කරා සාමාජීය සහ සදාචාරාත්මක වගකීම දරමින් වැඩ ලෝකය මෙහෙයවනු ලැබිය හැකි අනාගත කළමනාකරුවන් සංවර්ධනය කිරීමට සැලසුම් කෙරේ.

## 2. උපාධි පාඨමාලාවේ අරමුණු

i. සිසුන් ව්‍යාපාර කළමනාකරණයේ පුළුල් ක්ෂේත්‍රය තුළ අඛණ්ඩ සංවර්ධනයන් සමඟ පෙළ ගස්වමින් විශ්වවිද්‍යාලයේ දැක්ම, මෙහෙවර, සාරධර්ම සහ ප්‍රතිපත්තිවලට සමගාමීව උසස් තත්ත්වයේ ඉගෙනුම් අවස්ථාවන් පිරිනමන අධ්‍යයන වැඩසටහනක් ලබාදීම.

ii. ආයතනයේ අවසන් ප්‍රතිඵල ඵලදායී ආකාරයෙන් මුදාහැරීමට ආයතන සහ ඒවායේ පරිසරයන් සමස්තයක් වශයෙන් අවබෝධකර ගැනීමට සිසුන්ට ඉඩ ලබාදෙන අන්තර් විෂය දැනුම සහ විශ්ලේෂණාත්මක, ව්‍යවසායකත්ව, තාක්ෂණික සහ හුවමාරු කළ හැකි කුසලතා සංවර්ධනය කර ගැනීම සඳහා සිසුන්ට සහයවීම.

iii. සිසුන්ගේ දැනුම සහ හැකියාවන් සංවර්ධනය කර ගැනීම සඳහා සිසුන්ට සහයවීම සහ යාවජීව ඉගෙනුම තුළ ඔවුන් උද්යෝගයෙන් තබාගැනීම.

iv. ඉහළ අධ්‍යාපනය ප්‍රමිතීන් පවත්වා ගනිමින් කැමැත්තෙන් ඉගෙනීමට හිතකර, මිත්‍රශීලී, ප්‍රතිචාරාත්මක සහ සහයක අධ්‍යයන වාතාවරණයක් සැපයීම සහ

v. ගෝලීය ව්‍යාපාරික අධ්‍යාපනයේ ප්‍රමිතීන් සමඟින් සහ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (SLQF) සහ කළමනාකරණයේ මිනුම් සලකුණුවල (Management Benchmark Statement) අවශ්‍යතාවලට අනුව බාහිර උපාධියක් පිරිනැමීම.

## 3. උපාධි පාඨමාලාවේ අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල

උපාධිය සාර්ථකව නිම කිරීමෙන් පසු විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන බාහිර උපාධිධාරියෙකුට හැකි විය යුත්තේ:

i. ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ දැනුම සහ අවබෝධය ප්‍රදර්ශනය කිරීම.
ii. විවිධ සහ වෙනස්වන අවස්ථාවන්හි දී පන්ති කාමරය තුළ ලබාගත් දැනුම සහ ඉගෙනීමේ අත්දැකීම් සාර්ථකව යෙදවිය යුතු ආකාරය දැන ගැනීම
iii. සංවිධානවල බහුවිධ යථාර්තයන් අවබෝධ කර ගැනීමට සහ ඒවාට මුහුණ දීමට කළමනාකරණයේ සියලුම ක්‍රියාකාරී ක්ෂේත්‍ර සහ අනෙකුත් අදාල විෂයන් ඒකාබද්ධ කිරීම.
iv. පුද්ගලික, ආයතනික සහ සාමාජීය ප්‍රශ්න සහ ගැටලු සාකල්‍ය ලෙස මෙන්ම විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් බැලීමට සහ අවබෝධ කර ගැනීම.
v. ව්‍යාපාරික පරිසරයේ නැගී එන ප්‍රවනතා උපකල්පනය කිරීම සහ ඔවුන්ගේ ආයතන සඳහා නව්‍ය පරිචයන් වර්ධනය කිරීම.
vi. ව්‍යාපාර සන්දර්භය තුළ සුදුසු තාක්ෂණය භාවිතා කරමින් ලිඛිත සහ වාචික යන දෙඅංශයෙන්ම සඵලදායීව සන්නිවේදනය කිරීම.
vii. සමකාලීන සංවිධානවලට අදාල ව්‍යාපාරික පරිචයන් සහ ගැටලු විශ්ලේෂණය කිරීම සහ විවේචනාත්මකව ඇගයීම.
viii. ඕනෑම ව්‍යවසායක, කළමනාකරණ හෝ සාමාජීය තනතුරක් බාර ගැනීමට සංකල්පනාත්මක සහ ප්‍රායෝගික හැකියාවන් තිබීම
ix. අඛණ්ඩ ඉගෙනුම්කරුවෙකු සහ සම්පත් උත්ප්‍රේරකයෙකු වීම සහ,
x. යහපත් ගුණධර්ම වලින් සමන්විත සාදාචාර සම්පන්න සහ සමාජ වගකීම් සහිත ආචාරධර්මානුකූල පුරවැසියන් වීම

## 4. සාර්ථක උපාධිධාරියෙකු (Graduate Profile) : විස්තරය

ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිධාරියෙකු යනු සාදාචාරාත්මක, සාමාජීය සහ වෙනස් වන ගෝලීය ව්‍යාපාරික පරිසරයේ සමකාලීන ව්‍යාපාර ගැටලු දක්ෂ ලෙස සහ නිර්මාණශීලී ලෙස විසඳමින් තම සංවිධානය මෙහෙයවන පුද්ගලයෙකි.

## 5. යෝග්‍යතා නිර්ණායක

අයදුම්කරුවෙක් උපාධි වැඩසටහනට ඇතුළත් කර ගැනීම සඳහා:

I. පහත සඳහන් විෂය ලැයිස්තුවේ අවම වශයෙන් එක් විෂයයක් ඇතුළත්ව අ.පො.ස. උසස් පෙළ විභාගයේදී එක වරකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ තුනක් (3Cs) තිබිය යුතුය:

- ගිණුම්කරණය
- ව්‍යාපාර සංඛ්‍යාලේඛණ
- ව්‍යාපාර අධ්‍යයනය
- ඒකාබද්ධ ගණිතය
- ආර්ථික විද්‍යාව
- උසස් ගණිතය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- ගණිතය

II. අධ්‍යයනාංශය විසින් පවත්වනු ලබන තෝරාගැනීමේ පරීක්ෂණය සමත් වී තිබීම .

III. වයස අවුරුදු 18 ට අඩු නොවීම.

## 6. සිසුන් බඳවාගැනීම

අධ්‍යයනාංශය තරඟකාරී තෝරාගැනීමේ පරීක්ෂණයක් තුළින් සිසුන් බඳවා ගනී. කෙසේවෙතත්, උපරිම බඳවා ගැනීම සිසුන් තුන්සියය (300) නොඉක්මවිය යුතුය.

## 7. උපාධි පාඨමාලාවේ ව්‍යුහය

විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය SLQF මට්ටම - 5 යටතේ එන සාමාන්‍ය උපාධියකි. එය සම්මාන අනූ හයකින් (96) සහ කාල්පනික පැය හාරදහස් අටසියයකින් (4,800) සමන්විත වන අතර, අධ්‍යයන වර්ෂ තුනක් (03) ඇතුලත අධ්‍යයන වාර හයක් (06) යටතේ සැලසුම් කර ක්‍රියාත්මක කෙරේ.

## 8. උපාධි පාඨමාලාවේ විෂයමාලා ව්‍යුහය

උපාධි විෂයමාලාව අධ්‍යාපනික වසර තුනක කාලසීමාවක් තුළ අධ්‍යයන වාර හයක් (06) යටතේ වැටෙන සම්මාන අනූ හයකින් (96) සහ කාල්පනික පැය හාරදහස් අටසියයකින් (4,800) සමන්විත වේ. (8.1 වගුව බලන්න) එබැවින්, උපාධියේ එක් එක් අධ්‍යයන වාරය සඳහා විෂයය (Course) හතරක් (04) ඇතුලත් වන අතර එක් එක් විෂය සඳහා සම්මාන හතර (four credits) බැගින් වේ.

වගුව **8.1:** උපාධි පාඨමාලාවේ විෂය මාලාවේ ව්‍යුහය

| පාඨමාලා කේතය | පාඨමාලාවේ නම | සම්බන්ධ පැය | කාල්පනික පැය | සම්මාන |
|---|---|---|---|---|
| **1 වසර - I අධ්‍යයන වාරය** | | | | |
| BSE 1401 | කළමනාකරණ මූලධර්ම | 30 | 200 | 4 |
| BSE 1402 | කළමනාකරුවන් සඳහා ආර්ථික විද්‍යාව | 30 | 200 | 4 |
| BSE 1403 | කළමනාකරුවන් සඳහා ප්‍රමාණාත්මක ක්‍රම | 30 | 200 | 4 |
| BSE 1404 | ව්‍යාපාර සන්නිවේදනය | 30 | 200 | 4 |
| **1 වසර - II අධ්‍යයන වාරය** | | | | |
| BSE 1405 | කළමනාකරණ කුසලතා සංවර්ධනය | 30 | 200 | 4 |
| BSE 1406 | කළමනාකරුවන් සඳහා තොරතුරු තාක්ෂණය | 30 | 200 | 4 |
| BSE 1407 | ව්‍යාපාර නීතිය | 30 | 200 | 4 |
| BSE 1408 | කළමනාකරුවන් සඳහා ගිණුම්කරණය | 30 | 200 | 4 |
| **2 වසර - I අධ්‍යයන වාරය** | | | | |
| BSE 2401 | සංවිධාන චර්යාව | 30 | 200 | 4 |
| BSE 2402 | මානව සම්පත් කළමනාකරණය | 30 | 200 | 4 |
| BSE 2403 | අලෙවි කළමනාකරණය | 30 | 200 | 4 |
| BSE 2404 | සංකාර්ය කළමනාකරණය | 30 | 200 | 4 |
| **2 වසර - II අධ්‍යයන වාරය** | | | | |
| BSE 2405 | ඵලදායිතාව සහ ගුණාත්මකභාවය සඳහා කළමනාකරණය | 30 | 200 | 4 |
| BSE 2406 | මූල්‍ය කළමනාකරණය | 30 | 200 | 4 |
| BSE 2407 | ව්‍යාපාර තොරතුරු පද්ධති | 30 | 200 | 4 |
| BSE 2408 | ව්‍යවසායකත්වය | 30 | 200 | 4 |
| **3 වසර - I අධ්‍යයන වාරය** | | | | |
| BSE 3401 | ව්‍යාපාර ආචාරධර්ම සහ ආයතනික සමාජීය වගකීම | 30 | 200 | 4 |
| BSE 3402 | සංකාර්ය පර්යේෂණ | 30 | 200 | 4 |
| BSE 3403 | ඩිජිටල් ව්‍යාපාර (Digital Business) | 30 | 200 | 4 |
| BSE 3404 | සංවර්ධන ආර්ථික විද්‍යාව | 30 | 200 | 4 |
| **3 වසර - II අධ්‍යයන වාරය** | | | | |
| BSE 3405 | උපායමාර්ගික කළමනාකරණය | 30 | 200 | 4 |
| BSE 3406 | සංවිධාන වෙනස සහ සංවර්ධනය | 30 | 200 | 4 |
| BSE 3407 | ජාත්‍යන්තර ව්‍යාපාර කළමනාකරණය | 30 | 200 | 4 |
| BSE 3408 | මානව සම්පත් සංවර්ධනය | 30 | 200 | 4 |
| එකතුව | | **720** | **4800** | **96** |

**8.2 උපාධි පාඨමාලවේ අධ්‍යාපනික ප්‍රවේශය සහ අධ්‍යයන වාර ව්‍යුහය**

විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය, සාමාන්‍ය බාහිර උපාධි වැඩසටහනක් වන බැවින්, අධ්‍යයනාංශය උපාධිය තුළ පිරිනමන විෂයයන්/පාඨමාලා පිළිබඳ විධිමත් දේශන සහ/හෝ පාඨමාලා සැසි පිරිනැමීම හෝ පැවැත්වීම සිදු නොකරයි. ඒ වෙනුවට, සිසුන් පිළිබඳ ස්වයං-මෙහෙයුම් අධ්‍යයනය දිරිමත් කිරීමට පහසුකම් සපයයි. කෙසේවෙතත්, මෙම ඉගෙනුම් ක්‍රියාවලියේ කොටසක් ලෙස, අධ්‍යයනාංශය උපාධි වැඩසටහනේ එක් එක් අධ්‍යයන වාරය තුළ සම්මන්ත්‍රණ මාලාවක් පවත්වනු ලබයි.

**9. උපාධි පාඨමාලවේ කාලසීමාව**

අවම කාලසීමාව : වසර තුනකි (03)

උපරිම කාලසීමාව : වසර හතකි (07). එබැවින්, සිසුන් අඛණ්ඩව වසර හතකට (07) නොවැඩි කාලසීමාවක් තුළ උපාධිය සම්පූර්ණ කළ යුතුය.

**10. උපාධි පාඨමාලාවේ මාධ්‍යය**

සිසුන්ගේ කාර්යසාධනය පරිදි, පළමු වසරේ සිට තෙවැනි වසර දක්වා සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් උපාධිය පිරිනමනු ලැබේ. කෙසේවෙතත්, උපාධි වැඩසටහනේ කාලය තුළදී භාෂා මාධ්‍ය වෙනස් කිරීමේ විකල්පය සිසුන්ට හිමි නොවේ.

**11. උපාධි පාඨමාලාවේ ගාස්තු**

උපාධියේ වැඩසටහන් ගාස්තුව රු. 185,000.00ක් වන අතර, එම මුදල සම්පූර්ණයෙන් හෝ වාරික පදනම මත ගෙවිය යුතුය (වගුව 11.1බලන්න). මෙම මුදලින් වැඩසටහනේ නැවත විභාග සඳහා ලියාපදිංචි ගාස්තුව සහ විභාග ගාස්තුව හැර ලියාපදිංචි ගාස්තුව, සම්මන්ත්‍රණ ගාස්තුව සහ විභාග ගාස්තුව ආවරණය කෙරේ.

**වගුව 11.1: වාරික පදනම මත ගෙවීම**

| වාරිකය | මුදල (රු.) |
|---|---|
| 1 වැනි වාරිකය (ලියාපදිංචියේදී) (පාඨමාලා ගාස්තුව + ලියාපදිංචි ගාස්තුව) | 75,000.00 |
| 2 වැනි වාරිකය (පළමු වසර පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණයට පෙර) | 60,000.00 |
| 3 වැනි වාරිකය (දෙවැනි වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණයට පෙර) | 50,000.00 |
| එකතුව | 185,000.00 |

## 12. සිසු කාර්යසාධනය ඇගයීම සහ ශ්‍රේණිගතකරණ ක්‍රමය

උපාධියේ සිසු කාර්යසාධනය ඇගයීමට අඛණ්ඩ ඇගයීම් සහ අවශ්‍ය අවස්ථාවලදී අවසාන අධ්‍යයන වාර විභාගය යන දෙකම ඇතුළත් විය හැකිය. කෙසේවෙතත්, අඛණ්ඩ ඇගයීම උපාධියේ යම් පාඨමාලාවක සමස්ථ ඇගයීමේ පහෙන් එකක් හෝ සියයට විස්ස (20) නොඉක්මවිය යුතුය. සිසු කාර්යසාධනය, විභාග රෙගුලාසි සහ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය (EDECU) හි අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ඇගයීමට ලක් කරනු ලැබේ. පීඨය සහ විශ්වවිද්‍යාලය ලකුණු 12 පරිමාණයෙන් ශ්‍රේණිගත කරනු ලබන අතර එය E සිට A+ දක්වා පරාසයක් ගනියි. (වගුව 12.1 බලන්න).

**වගුව 12.1: ශ්‍රේණිගතකරණ පරිමාණ**

| ලකුණු පරාසය | ශ්‍රේණියේ අක්ෂර | ශ්‍රේණියේ ලකුණු |
|---|---|---|
| 85-100 | A+ | 4.00 |
| 70-84 | A | 4.00 |
| 65-69 | A- | 3.70 |
| 60-64 | B+ | 3.30 |
| 55-59 | B | 3.00 |
| 50-54 | B- | 2.70 |
| 45-49 | C+ | 2.30 |
| 40-44 | C | 2.00 |
| 35-39 | C- | 1.70 |
| 30-34 | D+ | 1.30 |
| 25-29 | D | 1.00 |
| 00-24 | E | 0.00 |

### 12.2 ශ්‍රේණි ලකුණුවල සාමාන්‍ය ගණනය කිරීම සඳහා මාර්ගෝපදේශ

ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) සිසුවෙකුගේ සමස්ත අධ්‍යාපන ජයග්‍රහනයක සංඛ්‍යාත්මක නියෝජනයකි. GPA සිසුවෙක් ලබාගන්නා ශ්‍රේණියේ අකුර තුළ මුලු සම්මාන පැය ගණනින් උපයන ලද ශ්‍රේණියේ මුළු ලකුණු බෙදමින් ලබාගන්නා ඵලයයි. ශ්‍රේණියේ ලකුණු සාමාන්‍ය ගණනය කිරීමේදී ස්ථාන දෙකකට ඉහළ දශම ලොප් කරනු ලැබුවත් වටකුරු නොකරයි.

**GPA ගණනය කිරීම සඳහා සූත්‍රය පහතින් දැක්වේ**

GPA = <u>උපයනලද ශ්‍රේණි ලකුණු වටිනාකම්වල මුළු ගණන</u>

සම්මාන පැය මුළු ගණන

$$GPA = \frac{\sum_{i=1}^{N} (සම්මාන\ පැය)_i \ X\ (ශ්‍රේණියේ\ ලකුණු)_i}{\sum_{i=1}^{N} (සම්මාන\ පැය)_i}$$

එහිදී, i= පාඨමාලාවේ අංකය

N = සලකාබලන පාඨමාලා මුළු ගණන

**12.3 අවසන් අධ්‍යයන වාර විභාගය සහ අඛණ්ඩ ඇගයීම**

**12.3.1** බාහිර විභාග අධ්‍යයන මණ්ඩලය, අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ කමිටුව සහ සනාතන සභාව විසින් වෙනස් ආකාරයකින් අනුමත කර ඇත්නම් මිස, එක් එක් පාඨමාලාවට එක් එක් අධ්‍යයන වාරය අවසානයේදී අවසාන විභාගයක් අවශ්‍ය වේ. විභාගයේ කාලසීමාව එක් එක් පාඨමාලාවේ අවශ්‍යතා මත රුදෙමින් වෙනස් විය හැක. පොදුවේ ඒවා පැය තුනක කාලයකි.

**12.3.2** ඊට අමතරව, එක් එක් පාඨමාලා සඳහා අඛණ්ඩ ඇගයීම් සංරචකයක් ඇතුළත් විය හැක. අඛණ්ඩ ඇගයීම් ක්‍රමයට වාර සහ පර්යේෂණ පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ඉදිරිපත් කිරීම්, ප්‍රායෝගික වාර්තා, තීරණාත්මක සිදුවීම්, කුසලතා ගොඩනගන්නන්, පන්ති සහභාගිත්වය යනාදිය ඇතුළත් විය හැක.

**12.3.3** පාඨමාලාවක් සඳහා සමස්ත ශ්‍රේණිය එම පාඨමාලාව සඳහා සියලුම ශ්‍රේණිගත ඇගයීම්වල කාර්යසාධනය මත පදනම් වේ.

**12.3.4** ශාස්ත්‍රීය මණ්ඩලය විසින් වෙනස් ආකාරයකින් අනුමත කර ඇත්නම් මිස, යම් අයදුම්කරුවෙක් විභාගය සඳහා අධ්‍යයන පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු පවත්වනු ලබන විභාගයේ පළමු අවස්ථාව මත එක් එක් විභාගය සඳහා ඔහු/ඇය පෙනී සිටිය යුතුය.

**12.3.5** අධිකාරි බලය නොමැතිව හෝ සාධාරණ හේතුවක් නොමැතිව යම් විභාගයක් සඳහා පෙනී සිටීමට අසමත් වූ සිසුන්ට එම විභාගය සඳහා ‘AB' (නොපැමිණී) සලකුණක් ලබා දෙනු ලැබේ. මෙම සලකුණ අසමත් ශ්‍රේණිය (E) ට සමාන වේ.

**12.4 පාඨමාලාවන් සඳහා අවසාන ලකුණු ගණනය කිරීම සඳහා මාර්ගෝපදේශ**

**12.4.1** අවසන් අධ්‍යයන වාර විභාගය පාඨමාලාවක් සඳහා පැවරුණු අවසන් ලකුණුවලින් 100%ක් හෝ 80%ට නොවැඩි බරක් දරනු ඇත. ඉහත දෙයට යම් ව්‍යතිරේඛයක වේ නම්, බාහිර විභාග අංශය, අධ්‍යයන මණ්ඩලය, පීඨ මණ්ඩලය, කළමනාකරණ කමිටුව සහ සනාතන සභාව විසින් අනුමත කරනු ලැබේ.

**12.4.2** යම් පාඨමාලාවක් සඳහා අඛණ්ඩ ඇගයීමක් තිබිය යුතු බවට තීරණය කරන්නේනම්, අඛණ්ඩ ඇගයීම් සංරචකය පාඨමාලාවක් සඳහා පැවරුණු අවසන් ලකුණුවලින් 20%කට නොවැඩි බරක් දරනු ඇත. මැදි අධ්‍යයන වාර විභාගය/පරීක්ෂණය/ප්‍රශ්නාවලිය, වාර සහ පර්යේෂණ පත්‍රිකා, සිද්ධි අධ්‍යයන, ඉදිරිපත් කිරීම්, ප්‍රායෝගික වාර්තා, .තීරණාත්මක

සිදුවීම්, කුසලතා ගොඩනගන්නන්, පන්ති සහභාගිත්වය වැනි අඛණ්ඩ ඇගයීම් එකක් හෝ කිහිපයක ලකුණු සමන්විත විය හැකිය.

**12.4.3** යම් අයදුම්කරුවෙක් පාඨමාලාවක් සඳහා අවශ්‍ය අඛණ්ඩ ඇගයීම් සියල්ලම සම්පූර්ණ කර නොමැති අවස්ථාවලදී, අඛණ්ඩ ඇගයීම් සඳහා වෙන්කරන ලද මුළු ලකුණු මත පදනම් වී අවසාන ලකුණු ගණනය කරනු ලැබේ. උදාහරණයක් ලෙස, උපලේඛනගත එක් එක් අඛණ්ඩ ඇගයීම් 2ක් සඳහා ලකුණු 10ක් වෙන් කර ඇති සහ අයදුම්කරු 1ක් අඛණ්ඩ ඇගයීමක් සම්පූර්ණ කර ලකුණු 8ක් ලබා ගෙන ඇති අවස්ථාවකදී, එම පාඨමාලාව සඳහා අඛණ්ඩ ඇගයීම සඳහා ඔහුගේ/ඇයගේ අවසාන ලකුණු 8/20 වේ.

**12.4.4** අඛණ්ඩ ඇගයීම් වෙනුවට යම් පාඨමාලාවකට මැදි අධ්‍යයන වාර විභාගය/ පරීක්ෂණය/ප්‍රශ්නාවලිය (එක් දින විභාග) අයත් වේ නම්, විභාගය/පරීක්ෂණය/ප්‍රශ්නාවලිය සඳහා ලබාගෙන ඇති ලකුණු අඛණ්ඩ ඇගයීම් ලකුණු ලෙස සලකනු ලැබේ.

**12.4.5** 12.6 වගන්තියේ දැක්වෙන වලංගු හේතු සහිතව මැදි අධ්‍යයන වාර විභාගය /පරීක්ෂණය/ප්‍රශ්නාවලිය (එක් දින විභාගය) සඳහා නොපැමිණි සිසුවෙකුට ඉදිරි අධ්‍යාපනික වසරේ විභාගය/පරීක්ෂණය/ප්‍රශ්නාවලිය හෝ අඛණ්ඩ ඇගයීම කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. නොපැමිණීම සඳහා වලංගු හේතුවක් නොමැතිනම්, එම සිසුවාට "00" (බින්දුව) ලකුණක් ලබා දෙනු ලැබේ.

**12.4.5** පාඨමාලාවක් අසමත්වීම හෝ වලංගු හේතු නොමැතිව නොපැමිණීම හේතු කොට ගෙන පාඨමාලාවක් සඳහා නැවත පෙනී සිටින සිසුන්ට මැදි අධ්‍යයන වාර විභාගය /පරීක්ෂණය/ප්‍රශ්නාවලිය සඳහා නැවත පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. පාඨමාලාව සඳහා අවසාන ලකුණු 100% බර සහිත අවසාන විභාගයේ ලකුණු භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර නමුත් උපරිමය 40%කි (12.8.3 වගන්තිය බලන්න).

**12.5 පාඨමාලාවක් සමත්වීම හෝ අසමත්වීම**

යම් අයදුම්කරුවෙක් එම පාඨමාලාව සඳහා 40% හෝ ඉහළ සමස්ථ සාමාන්‍යයක් (අඛණ්ඩ ඇගයීමේ බරතබන ලද සාමාන්‍ය ලකුණු (යම් පාඨමාලාවක් අඛණ්ඩ ඇගයීම් ලබා නොදීමට තීරණය කරයිනම්, මෙය සලකා බලනු නොලැබේ) සහ අවසන් අධ්‍යයන වාර විභාගය) ලබා ගන්නේ නම් පාඨමාලාව සමත් වී ඇති බවට සලකුණු ලැබේ.

**12.5.1** යම් අයදුම්කරුවෙක් අවසන් අධ්‍යයන වාර විභාගය හෝ මැදි අධ්‍යයන වාර විභාගය සඳහා නොපැමිණ ඇත්නම්, පහත සඳහන් සලකුණු සුදුසු පරිදි දක්වනු ලැබේ.

**12.5.1.1** ශාස්ත්‍රීය මණ්ඩලය විසින් අනුමත කර ඇති වෛද්‍ය හේතුවක් මත නොපැමිණ සිටීම 'MC' (වෛද්‍ය) සලකුණ ලබා දෙනු ලැබේ. 10.6.1 වගන්තිය බලන්න.

**12.5.1.2** ශාස්ත්‍රීය මණ්ඩලය විසින් අනුමත කර ඇති වලංගු හේතු නිසා නොපැමිණ සිටීම "DFR" (ප්‍රමාද වූ) සලකුණ ලබා දෙනු ලැබේ. 10.6.2 වගන්තිය බලන්න.

**12.5.1.3** වලංගු හේතු නොමැතිව නොපැමිණ සිටීම "AB" (නොපැමිණි) සලකුණ ලබා දෙනු ලැබේ.

**12.6 විභාගයකට නොපැමිණ සිටීම සඳහා වලංගු හේතු**

සිසුවාගේ බරපතල රෝග තත්ත්වයක් හෝ ආසන්න පවුලේ යම් සාමාජිකයෙකුගේ මරණයක් හෝ බාහිර විභාග අංශය, අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ කමිටුව විසින් පිළිගනු ලබන යම් වෙනත් හේතුවක් මත සිසුවා විභාගයට නොපැමිණ සිටීම සනාතන සභාව විසින් අනුමත කර ඇත්නම්, සමාව ලබා දෙනු ලැබේ. සිසුවෙකුට සමාව ලබාදෙන්නේනම්, ඔහුට/ඇයට වරප්‍රසාද සහිතව එනම් කිසිදු ලකුණු අඩුකිරීමක් නොමැතිවම ඊළඟ ආසන්නතම අවස්ථාවේදී විභාගයට පෙනී සිටිය හැකිය.

**12.6.1** වෛද්‍ය හේතු නිසා විභාගවලට නොපැමිණි අයදුම්කරුවෙක් රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. අනුමැතිය සඳහා අධ්‍යයන මණ්ඩලය, පීඨයේ මණ්ඩලය සහ සනාතන සභාවට ඉදිරිපත් කිරීමට නියමිත ප්‍රශ්න පත්‍රය සඳහා විභාගය පැවැත්වීමෙන් පසු සති දෙකක් තුළ බාහිර විභාග අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත මෙය ඉදිරිපත් කළ යුතුය. එවැනි අවස්ථාවක, ශිෂ්‍යයා එම පාඨමාලාව සඳහා 'MC' සලකුණක් ලබාගනී.

**12.6.2** පවුලේ වියෝවීම (දෙමව්පියන්, සහෝදරයා, සහෝදරිය, සහ විවාහකනම් කලත්‍රයා හෝ ළමයා) හේතු කොට ගෙන විභාගයක් සඳහා යම් අයදුම්කරුවෙක් නොපැමිණීම සඳහා මරණ සහතිකය සහ සම්බන්ධතාව පිළිබඳ සුදුසු සාක්ෂියක් ඉදිරිපත් කිරීම මඟින් බාහිර විභාග අධ්‍යයන මණ්ඩලය, අධ්‍යයන කළමනාකරණ කමිටුව සහ සනාතන සභාවේ අනුමැතිය ලබා ගන්නේනම්, එවැනි අවස්ථාවක, එම සිසුවා එම පාඨමාලාව සඳහා 'DFR" සලකුණක් ලබාගනී.

**12.7 වෛද්‍ය හේතුන් මත ඉවත්වීම**

යම් සිසුවෙකුට ලියවිලි සාක්ෂිය සහිතව වලංගු වෛද්‍ය හේතු මත අධ්‍යයන වාරය තුළ ඕනෑම අවස්ථාවක දී පාඨමාලාවකින් ඉවත්විය හැකිය. එවැනි අවස්ථාවකදී, එම සිසුවාට 'MC' සලකුණක් ලබා දේ. වෛද්‍ය හේතු මත ඉවත්වීමක් ඉල්ලා සිටීමේදී බාහිර විභාග අංශයේ, පීඨයේ සහ විශ්ව විද්‍යාල මාර්ගෝපදේශ සිසුවා අනුගමනය කළ යුතුය. වෛද්‍ය හේතු මත දීර්ඝ කරන ලද කාලසීමාවක් සඳහා ලිඛිත අනුමැතිය ලබා ගන්නේනම් මිස යම් සිසුවෙක් ඉදිරි වසර තුළ එම පාඨමාලාව සඳහා පෙනී සිටිය යුතුව ඇත.

**12.8. පාඨමාලාවක් නැවත කිරීම**

**12.8.1** 'D' හෝ 'E' ශ්‍රේණියක් ලබා ගන්නා යම් සිසුවෙක් ඉදිරි අධ්‍යයන වාරය තුළ එම පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම මඟින් එම පාඨමාලාව නැවත කළ යුතුය.

**12.8.2** 'C-' හෝ 'D+' ශ්‍රේණියක් ලබා ගන්නා යම් සිසුවෙක් ඉදිරි අධ්‍යයන වාරය තුළ එම පාඨමාලාව සඳහා ලියාපදිංචිවීම මඟින් එම පාඨමාලාව නැවත කළ හැකිය.

**12.8.3** යම් විභාගයක පාඨමාලාව/පාඨමාලා නැවත කරන යම් අයදුම්කරුවෙක් ලබාගන්නා සත්‍ය ලකුණු නොසලකා ඔහු/ඇය නැවත කළ එක් එක් පාඨමාලාව/පාඨමාලා සඳහා 40% කට වඩා ('C' ශ්‍රේණියක් සඳහා ලබා දී ඇති අවම ලකුණ) ලබා ගැනීමට සුදුසුකම් නොලබයි. නැවත සිදුකරන පාඨමාලාවක් සඳහා ලබා දී ඇති උපරිම ශ්‍රේණිය C වේ.

**12.8.4** නැවත සිදුකළ උත්සාහයන්හි දී ලබාගත් ශ්‍රේණිය පෙර උත්සහයකදී ලබාගත් ශ්‍රේණියට පහළ ශ්‍රේණියක් වුවහොත් ලබා ඇති වඩා වැඩි ඉහළ ශ්‍රේණිය බල පැවැත්වෙනු ඇත.

**12.8.5** පාඨමාලාවක් පිළිබඳ නැවත සිදුකරන අඛණ්ඩ ඇගයීම (12.4 වගන්තිය බලන්න) මධ්‍ය වාර විභාගය/ පරීක්ෂණය/ ප්‍රශ්නාවලියකදී 12.6 වගන්තියෙහි සඳහන් පිළිගත හැකි හේතුවක් සහිතව නොපැමිණෙන යම් අයදුම්කරුවෙකුට කිසිදු ලකුණු සීමා කිරීමක් නොමැතිව ඊළඟ අධ්‍යයන වාරයේ දී එකී ඇගයීම සිදුකිරීමට තවත් අවස්ථාවක් ලබා දිය යුතුය.

**12.9** **පාඨමාලාවක අවසාන අධ්‍යයන වාරය නැවත කිරීම**

**12.9.1** අවසාන අධ්‍යයන වාරය සඳහා බාහිර විභාග අංශය විසින් නැවත විභාගයක් පවත්වනු නොලැබේ. යම් ශිෂ්‍යයෙකු විභාගයක් අසමත් වුවහොත් හෝ අසනීප තත්ත්වයක් හේතුවෙන් හෝ 12.6 වගන්තියේ දක්වා ඇති වෙනත් වලංගු හේතුවක් නිසා විභාගයට පෙනී සිටීමට නොහැකි වුවහොත්, ඔහුට / ඇයට ඊළඟ අධ්‍යාපනික වර්ෂය තුළදී පවත්වනු ලබන එවැනි විභාගයක් සඳහා පෙනී සිටීමට අවස්ථාව තිබේ.

**12.9.2** ඉහත 12.6 වගන්තියේ දක්වා ඇති වලංගු හේතුවක් සහිතව අවසාන අධ්‍යයන වාරයේ විභාගයට නොපැමිණෙන අපේක්ෂකයෙකු විසින් එය ඉදිරිපත් කර බාහිර විභාග අංශය, අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ කමිටුව සහ සනාතන සභාව විසින් පිළිගෙන ඇති අවස්ථාවක, ඔහු/ ඇය මුල් අවස්ථාව භාවිත කර නොමැති සේ සලකනු ලබයි.

වරප්‍රසාද සහිතව ඊළඟ අධ්‍යාපනික වසර තුළ එම පාඨමාලාව සඳහා ලියාපදිංචිවීම මඟින් එම පාඨමාලාවේ අවසන් අධ්‍යයන වාර විභාගය සඳහා එවැනි අපේක්ෂකයෙක් පෙනී සිටිය යුතුය. වලංගු හේතුවක පදනම මත දීර්ඝකළ කාලසීමාවක් සඳහා ලිඛිත අනුමැතියක් ලබාගෙන ඇත්නම් මිස ඊළඟ අධ්‍යයන වර්ෂය තුළ එම පාඨමාලාව සඳහා එවැනි අපේක්ෂකයෙක් පෙනී සිටිය යුතුය.

**12.10** **අවසන් අධ්‍යයන වාර විභාගය සඳහා නොපැමිණි අය**

යම් අයදුම්කරුවෙක් විසින් වලංගු හේතුවක් ඉදිරිපත් කර ඇත්නම් සහ බාහිර විභාග අංශය, අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ කමිටුව සහ සනාතන සභාව විසින් එය පිළිගෙන ඇත්නම් මිස, සමස්ත අවසන් අධ්‍යයන වාර විභාගයක් සඳහා නොපැමිණි සිටි එම අයදුම්කරු ඔහු/ඇය අවස්ථාවක් භාවිතා කර ඇති ලෙස සලකනු ලැබේ. පිළිගත් වලංගු හේතුවක් සහිත යම් අයදුම්කරුවෙක් ඊළඟ ආසන්න අවස්ථාවේදී සමස්ත අවසන් අධ්‍යයන වාර විභාගය ලබාගැනීමට සහ කිසිදු සීමාවකින් තොරව පාඨමාලාවන් සඳහා ශ්‍රේණි ලබා ගැනීමට සුදුසුකම් ලබයි. යම් අයදුම්කරුවෙක් වලංගු හේතුවක් ඉදිරිපත් නොකර ඊළඟ ආසන්න අවස්ථාවේදී සමස්ත අවසන් අධ්‍යයන වාර විභාගය ලබාගැනීම මඟහරින්නේනම්, භාවිතා කරන ලද උත්සාහයක් ලෙස එය සලකනු ලැබේ.

**13.** **උපාධි පාඨමාලාව සමත්වීම**

**13.1** **උපාධි වැඩසටහනක වසරක් සමත්වීම**

යම් අයදුම්කරුවෙක් වසර සඳහා 2.00 ට නොඅඩු අවම GPAක් උපයාගෙන ඇත්නම් සහ අසමත් ශ්‍රේණි (D හෝ E), නොමැතිනම්, ඔහු/ඇය උපාධි වැඩසටහනේ යම් වසරක් සමත්වී ඇති බවට සලකනු ලැබේ.

**13.2 අධ්‍යයන වාර විභාගවල අසමත් විෂයයන් සමත්වීම**

ඉහත 13.1 වගන්තියේ දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අපොහොසත් වී ඇති යම් අයදුම්කරුවෙක් අසමත් වූ පාඨමාලාව/පාඨමාලා (සියලුම D හෝ E ශ්‍රේණි) සඳහා නැවත පෙනී සිටිය යුතු අතර, ඉහත 12.10 වගන්තියේ දැක්වෙන අදාළ සීමාවන් යටතේ එම පාඨමාලා සමත් විය යුතුය. යම් අයදුම්කරුවෙක් 2.00 ට අඩු GPAක් උපයාගෙන ඇත්නම් ඔහු/ඇය C- සහ D+ සහිත පාඨමාලා සඳහා පෙනී සිටිය යුතු අතර ඉහත 12.10 වගන්තියේ දැක්වෙන අදාළ සීමාවන් යටතේ 2.00 ට නොඅඩු අවම GPAක් උපයාගත යුතුය.

**13.3 උපාධිය සම්පූර්ණ කිරීම - උපාධිය සඳහා අවශ්‍යතා**

සිසුවෙකු විසින් ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය හිමිකර ගැනීම සඳහා:

- අදාළ උපාධි වැඩසටහන සඳහා නියම කරන ලද අවම අධ්‍යයන වාර පැය ගණන සම්පූර්ණ කර තිබීම, සහ
- එක් එක් වසර සඳහා 2.00 ට නොඅඩු අවම GPA අගයක් උපයාගෙන තිබීම, සහ
- සමස්ත උපාධි වැඩසටහන සඳහා 2.00ක අවම සමස්ත GPA අගයක්, සහ
- අසමත් ශ්‍රේණි (D හෝ E) නොමැතිවීම, සහ
- අනුමත වලංගු හේතුවක් හැර විශ්වවිද්‍යාලයට මුලින්ම ඇතුළත් වූ අධ්‍යයන වර්ෂයේ සිට උපරිම වශයෙන් අධ්‍යයන වර්ෂ 7 ක් තුළ ඉහත දක්වා ඇති සියලුම අවශ්‍යතා සපුරාලීම.

කෙසේ වෙතත්, සිසුවෙකු විසින් උපාධි වැඩසටහනේ අවසන් උත්සාහයට ළඟා වූ විට සහ ඔහු/ඇය සියලු පාඨමාලා ඒකක සඳහා අවම වශයෙන් එක් වරක්වත් පෙනී සිට ඇත්නම්, එම ශිෂ්‍යයාගේ ප්‍රතිඵල තීරණය කිරීම සම්බන්ධයෙන් පහත ක්‍රියාපටිපාටි අනුගමනය කරයි.

I. අඛණ්ඩ ඇගයීම් සඳහා ලබා ගත් ලකුණු කිසියම් විෂයක් සඳහා ඉදිරියට ගෙන ගොස් නොමැති නම්, ඉදිරියට ගෙන යනු ලැබේ.
II. GPA අගය ගණනය කිරීමේදී ශිෂ්‍යයා ඕනෑම උත්සාහයක දී ලබා ගත් ඉහළම ලකුණු සලකා බලනු ලැබේ.
III. ශිෂ්‍යයෙකු 2.00 හෝ ඊට වැඩි සමස්ත GPA අගයක් ලබාගෙන තිබේ නම්, ඔහුට හෝ ඇයට ඉහත දක්වා ඇති උපාධිය සඳහා වන අවශ්‍යතා නොසලකා හරිමින් උපාධිය ප්‍රදානය කරනු ලැබේ.
IV. ඉහත I, II හා II හි දක්වා ඇති කරුණු GPA අගය ගණනය කිරීමේදී අදාල වේ. එබැවින් ශිෂ්‍යයාගේ ශ්‍රේණිගත කිරීම වෙනස් නොකල යුතු අතර උපරිම GPA අගය 2.00 විය යුතුය.

**14. පන්ති පිරිනැමීම**

***පළමු පෙළ පන්ති සාමාර්ථය ලබා ගැනීම***

පළමු පෙළ පන්ති සාමාර්ථයක් සහිත උපාධියක් පිරිනැමීම සඳහා ශිෂ්‍යයෙකු පහත සඳහන් සියලු අවශ්‍යතා සපුරාලිය යුතුය:

- ශිෂ්‍යයා සමස්ත උපාධි පාඨමාලාව තුළ 3.70 හෝ ඊට ඉහළ සමස්ත GPA අගයක් උපයා තිබිය යුතුය.
- ශිෂ්‍යයා උපාධි පාඨමාලාව තුළ ඇති විෂයයන්ගෙන් අවම වශයෙන් අඩක්වත් "A+" හෝ "A" ශ්‍රේණි ලබාගෙන තිබිය යුතුය.
- ශිෂ්‍යයා C ට වඩා පහළ ශ්‍රේණි ලබා නොතිබිය යුතුය.
- අනුමත වලංගු හේතුවක් හැර ලියාපදිංචි කළ පළමු අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුනක් (03) ඇතුළත ශිෂ්‍යයා මෙම අවශ්‍යතා සපුරාලිය යුතුය.

***දෙවන පෙළ ඉහළ පන්ති සාමාර්ථ ලබා ගැනීම***

දෙවන පෙළ (ඉහළ) පන්ති සාමාර්ථයක් සහිත උපාධියක් පිරිනැමීම සඳහා ශිෂ්‍යයෙකු පහත සඳහන් සියලු අවශ්‍යතා සපුරාලිය යුතුය.

- ශිෂ්‍යයා සමස්ත උපාධි පාඨමාලාව තුළ 3.30 හෝ ඊට ඉහළ සමස්ත GPA අගයක් ලබාගෙන තිබිය යුතුය.
- ශිෂ්‍යයා උපාධි පාඨමාලාව තුළ ඇති විෂයයන්ගෙන් අවම වශයෙන් අඩක්වත් A- ශ්‍රේණිය හෝ වඩා යහපත් ශ්‍රේණි උපයාගෙන තිබිය යුතුය.
- ශිෂ්‍යයා සමස්ත උපාධි පාඨමාලාව සඳහා දුර්වල (C- හෝ D+) ශ්‍රේණි දෙකකට වඩා උපයාගෙන නොතිබිය යුතුය.
- අනුමත වලංගු හේතුවක් හැර ලියාපදිංචි කළ පළමු අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුනක් (03) ඇතුළත ශිෂ්‍යයා මෙම අවශ්‍යතා සපුරාලිය යුතුය.

***දෙවන පෙළ (පහළ) පන්ති සාමාර්ථය ලබා ගැනීම***

දෙවන පෙළ (පහළ) පන්ති සාමාර්ථයක් සහිත උපාධියක් පිරිනැමීම සඳහා ශිෂ්‍යයෙකු පහත සහන් සියල අවශ්‍යතා සපුරාලිය යුතුය.

- ශිෂ්‍යයා සමස්ත උපාධි පාඨමාලාව තුළ 3.00 හෝ ඊට ඉහළ සමස්ත GPA අගයක් ලබාගෙන තිබිය යුතුය.
- ශිෂ්‍යයා උපාධි පාඨමාලාව තුළ ඇති විෂයයන්ගෙන් අවම වශයෙන් අඩක්වත් B+ ශ්‍රේණිය හෝ ඊට වඩා යහපත් ශ්‍රේණි උපයාගෙන තිබිය යුතුය.
- ශිෂ්‍යයා සමස්ත උපාධි වැඩසටහන සඳහා දුර්වල (C- හෝ D+) ශ්‍රේණි දෙකකට වඩා උපයා නොතිබිය යුතුය.
- අනුමත වලංගු හේතුවක් හැර ලියාපදිංචි කළ පළමු අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුනක් (03) ඇතුළත ශිෂ්‍යයා මෙම අවශ්‍යතා සපුරාලිය යුතුය.

## 15. උපාධිය වලංගු දිනය

ප්‍රථම වරට උපාධි III විභාගයට පෙනී සිටින සිසුන් සඳහා උපාධිය වලංගු දිනය III වන උපාධි විභාගයේ අවසාන දිනට පසුව එළැඹෙන වැඩ කරන දිනයකි. එම දිනය ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක් නොවේ.

පුනර් අපේක්ෂකයන්ගේ උපාධිය වලංගු දිනය අදාල පීඨය විසින් තීරණය කරනු ලැබේ.

## 16. ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර

අයදුම්කරුවන්ගේ කුසලතා පදනම සහ/හෝ ආර්ථික තත්ත්වය මත සුදුසුකම් ලත් අයදුම්කරුවන් සඳහා ශිෂ්‍යත්ව සහ/හෝ ශිෂ්‍යාධාර ගණනාවක් අධ්‍යයනාංශය විසින් ලබා දෙනු ඇත.

- 1 වන කාණ්ඩය: තෝරා ගැනීමේ පරීක්ෂණයේ ඉහළම දක්ෂතා දක්වන පස්දෙනා වෙත උපාධියේ පාඨමාලා ගාස්තු නිදහස් කිරීම සඳහා හිමිකම් ඇත.
- 2 වන කාණ්ඩය: සිසුන් පස්දෙනෙකුට ඔවුන්ගේ අධ්‍යාපන කුසලතා, තෝරා ගැනීමේ පරීක්ෂණ ලකුණු සහ ආර්ථික තත්ත්වය මත පදනම්ව පාඨමාලා ගාස්තුවෙන් නිදහස් වීමට හිමිකම් ඇත.
- 3 වන කාණ්ඩය: තවත් සිසුන් පස් දෙනෙකුට ඔවුන්ගේ ආර්ථික තත්ත්වය මත පදනම්ව උපාධියේ පාඨමාලා ගාස්තුවෙන් සියයට පනහක් (50%) නිදහස් වීමට හිමිකම් ඇත.

කෙසේවෙතත්, ශිෂ්‍යත්ව සහ/හෝ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම සහ/හෝ අඛණ්ඩව පවත්වාගෙන යාම පහත සඳහන් නිර්ණායකයන්ට යටත් වේ.

- ඉහත 2 සහ 3 වන කාණ්ඩය සඳහා සුදුසුකම් ලැබීමට, යම් අයදුම්කරුවෙක් අයදුම්පත් අවසන් කරන දිනට වයස අවුරුදු විසිතුනට (23) අඩු විය යුතුය.
- එක් ශිෂ්‍යත්වයක් සහ/හෝ ශිෂ්‍යාධාරයකට වඩා ලබා ගැනීමට කිසිදු අයදුම්කරුවෙකුට අයිතියක් නැත.
- ශිෂ්‍යත්ව සහ/හෝ ශිෂ්‍යාධාර අඛණ්ඩව පවත්වාගෙන යාම උපාධි වැඩසටහනේ ශිෂ්‍යත්ව/ ශිෂ්‍යාධාර ලාභියාගේ කාර්යසාධනයට යටත් වේ.
- ශිෂ්‍යත්ව සහ / හෝ ශිෂ්‍යාධාර සඳහා සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම උපාධි වැඩසටහනේ සම්බන්ධීකාරක සහ ව්‍යාපාර පරිපාලන අධ්‍යයනාංශයේ ප්‍රධානියා විසින් පත් කරන ලද එම අංශයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් සහ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී හෝ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් පත් කරන ලද වෙනත් පරිපාලන නිලධාරියෙක්ගෙන් සමන්විත තාවකාලික කමිටුවක් විසින් කළ යුතුය.

තාවකාලික කමිටුවේ නිර්දේශය/නිර්දේශවලට සහ විශ්ව විද්‍යාලයේ නීති සහ රෙගුලාසිවලට අනුකූලව ශිෂ්‍යත්ව සහ/හෝ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම සහ/හෝ අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධ්‍යයනාංශ ප්‍රධානියා විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

ඇමුණුම - පාඨමාලා විස්තර

## BSE 1401: කළමනාකරණ මූලධර්ම

මෙම හඳුන්වාදීමේ පාඨමාලාවේ අරමුණ වන්නේ සිසුන්ට කළමනාකරණයේ මූලික සංකල්ප, න්‍යායන් සහ කාර්යයන් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීමයි. 'කළමනාකරණය යනු ක්‍රියාවලියක්' යන අදහස වටා, සංවිධානය සහ එහි පරිසරයේ ප්‍රධාන අංගයන් පිළිබඳව සිසුන්ට හුරුවීමට පහසුකම් සැපයීම සඳහා පාඨමාලාව සැලසුම් කර ඇත. එම නිසා, පාඨමාලාව මඟින් කළමනාකරණ - සැලසුම් කිරීම, සංවිධානය කිරීම, නායකත්වය දීම, පෙළඹවීම, සන්නිවේදනය සහ පාලනය පිළිබඳ ක්‍රියාවලියේ ශක්තිමත් පදනමක් සමඟ සිසුන් සූදානම් කරනු ඇත. තවද, ආයතනවල කළමනාකරණයේ කාර්යභාරය කෙරෙහි සෘජු සහ/හෝ වක්‍ර බලපෑමක් ඇති කරන සමකාලීන ව්‍යාපාරික පරිසරයේ ගතිකතාවයන් සාකච්ඡා කරනු ඇත. මේ අනුව, පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් 'කළමනාකරණ මූලධර්ම' හා සමකාලීන සංවිධානවල කළමනාකරණයේ කාර්යභාරය අභිමුඛව සිසුන්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කර ගැනීමට ඔවුන් ශක්තිමත් කරනු ඇත.

## BSE 1402: කළමනාකරුවන් සඳහා ආර්ථික විද්‍යාව

මෙම පාඨමාලාවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ආර්ථික සංකල්ප සහ යෙදුම් පිළිබඳ මූලික අවබෝධයක් සිසුන්ට ලබා දීමයි. පාඨමාලාව කොටස් දෙකකින් සමන්විත වේ - එනම්, ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව සහ සාර්ව ආර්ථික විද්‍යාවයි. ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව යටතේ ඉල්ලුම හා සැපයුම, පාරිභෝගික හැසිරීම, නිෂ්පාදනය, නිෂ්පාදන පිරිවැය සහ වෙළෙඳපොළ ව්‍යුහයන් පිළිබඳ න්‍යායන් සාකච්ඡා කෙරේ. ජාතික ආදායම තීරණය කිරීම, සමස්ත ඉල්ලුම හා සැපයුම, රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්තිය, උද්ධමනය සහ විරැකියාව සාර්ව ආර්ථික විද්‍යාව යටතේ සාකච්ඡා කෙරේ. පාඨමාලාව අවසානයේදී, කළමනාකරණ තීරණ ගැනීමේදී සිසුන්ට ආර්ථික සංකල්ප සහ එම සංකල්පවල යෙදීම් පිළිබඳ මූලික අවබෝධයක් ලැබෙනු ඇත.

## BSE 1403: කළමනාකරුවන් සඳහා ප්‍රමාණාත්මක තාක්ෂණික ක්‍රම

මෙම පාඨමාලාව මඟින් ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රමාණාත්මක ක්‍රම යොදා ගැනීමේ හැකියාවන් පිළිබඳ දළ විශ්ලේෂණයක් සංවර්ධනය කිරීමට අවශ්‍ය ගණිතය සහ සංඛ්‍යාලේඛනවල මූලික මූලධර්ම, නීති සහ රීති සිසුන්ට හඳුන්වා දෙයි. පාඨමාලාවේ ප්‍රධාන අවධානය යොමු වී ඇත්තේ ව්‍යාපාර ගැටලු විසඳීම සඳහා ප්‍රමාණාත්මක ශිල්පීය ක්‍රම භාවිතා කිරීමේ කුසලතා සහ දෘෂ්ටිකෝණ සංවර්ධනය කිරීම පිළිබඳවය. මූලික වීජ ගණිත කාර්යයන්, අවකලනය, ඒකාබද්ධ කිරීම සහ මූල්‍ය ගණිතය වැනි ගණිතයේ ප්‍රධාන මාතෘකා කිහිපයක් පාඨමාලාවෙන් ආවරණය කරයි. එසේම, ඉන් විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රම, සම්භාවිතා බෙදාහැරීම් සහ වැදගත් දත්ත විශ්ලේෂණයන් ශිල්පීය ක්‍රම දෙකක්, සහසම්බන්ධය සහ ප්‍රතිගාමී විශ්ලේෂණය ඇතුළුව ව්‍යාපාර සංඛ්‍යාලේඛනවල මූලික සංකල්ප සහ ක්‍රම පිළිබඳ හඳුන්වාදීමක් සපයයි

## BSE 1404: ව්‍යාපාර සන්නිවේදනය

මෙය ඉංග්‍රීසි භාෂාවෙන් වෘත්තීය සන්නිවේදනය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් මූලික පාඨමාලාවකි. පාඨමාලාව මඟින් ගෝලීය ව්‍යාපාරික පරිසරය තුළ භාවිතා වන වාග් මාලාව සහ වාක්‍ය ඛණ්ඩ මෙන්ම ව්‍යාකරණ භාවිතය සහ ව්‍යාපාරයේ ක්‍රියාත්මක වීමට අවශ්‍ය කුසලතා පිළිබඳව අවධානය යොමු කරයි. පාඨමාලා අන්තර්ගතයට ව්‍යාකරණ පදනම, ව්‍යාපාර ලිපි හුවමාරුව, අවබෝධය, ප්‍රවණතා සහ ප්‍රස්තාර විස්තර, ව්‍යාපාර වාග්සම්ප්‍රදාය භාවිතය සහ ව්‍යාපාර වාර්තා ලිවීම ඇතුළත් වේ.

**BSE 1405:** **කළමනාකරණ නිපුණතා සංවර්ධනය කිරීම**

මෙම කුසලතා-නැඹුරු පාඨමාලාව මඟින්, වැඩ කරන ලෝකයේ ව්‍යාපාර කළමනාකරුවන්ගේ තිරසාර සාර්ථකත්වයට අත්‍යවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම පාඨමාලාව සිසුන්ගේ වර්තමාන 'කළමනාකරණ නිපුණතා' මට්ටම විවේචනාත්මකව මෙනෙහි කිරීමට හා තක්සේරු කිරීමට දිරිගන්වන අතර, එම නිපුණතා වර්ධනය කිරීමට ඔවුන්ට පහසුකම් සපයයි. එවිට ඔවුන් ස්වයං-විශ්වාසනීය ව්‍යාපාර කළමනාකරුවන් ලෙස වර්ධනය වේ. පාඨමාලා අන්තර්ගතයට සන්නිවේදනය, නායකත්වය, කණ්ඩායම් වැඩ, තීරණ ගැනීම, සාකච්ඡා සහ ගැටුම් නිරාකරණය වැනි කළමනාකරණ නිපුණතාවල ප්‍රධාන ක්ෂේත්‍ර ඇතුළත් වේ:

**BSE 1406:** **කළමනාකරුවන් සඳහා තොරතුරු තාක්ෂණය**

මෙය හඳුන්වාදීමේ මට්ටමේ පාඨමාලාවක් වන අතර, ඉන් තොරතුරු තාක්ෂණයට අදාළ මූලික සංකල්ප සපයයි. පරිගණක, පරිගණක දෘඩාංග, පරිගණක මෘදුකාංග, පරිගණක ජාල, අන්තර්ජාලය සහ වෙබ්, තොරතුරු පද්ධති සහ පද්ධති සංවර්ධනය, ඊ-වාණිජ්‍යය, දත්ත සමුදාය, පරිගණක ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ ව්‍යාපාරික සංවිධානවල තොරතුරු තාක්‍ෂණය භාවිත කිරීමට අදාළ ආචාර ධර්ම වැනි තොරතුරු තාක්ෂණයේ ප්‍රධාන තේමාවන් සහ මාතෘකා මෙම පාඨමාලාවෙන් ආවරණය කෙරේ.

**BSE 1407:** **ව්‍යාපාර නීතිය**

මෙම පාඨමාලාව මඟින් සිසුන්ට ව්‍යාපාරික ලෝකයට අදාළ නීතිමය සංකල්පවලට විශේෂ අවධානය සහිතව නීතියේ මූලික මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දීම අරමුණු කර ගෙන ඇත. මෙම පාඨමාලාව තේමාවන් තුනක් යටතේ ව්‍යුහගත කර ඇත. එනම් නීතියේ මූලික මූලධර්ම, බැඳීම් නීතිය සහ සමාගම් නීතියයි. ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය වැනි ව්‍යාපාරවල නව ප්‍රවණතා ඇතුළුව එදිනෙදා වාණිජ ක්‍රියාකාරකම් සහ ගනුදෙනු සඳහා අත්‍යවශ්‍ය ව්‍යාපාර නීතියේ මූලික මූලධර්ම ව්‍යාපාර නීතිය පිළිබඳ අදාළ මූලික නෛතික දැනුම ලබා ගැනීම සඳහා සිසුන්ට ඉඩ සලසන පාඨමාලා විෂය නිර්දේශයේ කොටසකි. එමනිසා, පාඨමාලාව මඟින් ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ නෛතික න්‍යායන්, මූලධර්ම සහ අදාළ නීති හඳුනා ගැනීමට සිසුන්ට පහසුකම් සැලසීම අරමුණු කරයි. තවද, ඉන් සරල නීතිමය ගැටලු විසඳීමට සහ ව්‍යාපාර නීතිය යොදා ගැනීම සම්බන්ධයෙන් ඔවුන්ගේ විවේචනාත්මක චින්තනය සංවර්ධනය කිරීමට සිසුන්ට පහසුකම් සපයයි.

**BSE 1408:** **කළමනාකරුවන් සඳහා ගිණුම්කරණය**

මෙම පාඨමාලාව මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණයේ මූලික න්‍යායාත්මක හා ප්‍රායෝගික අංශ ආවරණය කරයි. එමනිසා, ව්‍යාපාර තීරණ ගැනීමේදී මූල්‍ය ගිණුම්කරණයේ මෙන්ම පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණයේ සංකල්ප හා ශිල්පීය ක්‍රම යොදා ගැනීම පිළිබඳ අවබෝධයක් ලබා දීම පාඨමාලාවෙන් අරමුණු කරයි. මෙම පාඨමාලාව යටතේ, සිසුන්ට ගිණුම්කරණ ක්‍රියාවලිය, සීමිත වගකීම් සමාගම් ඇතුළුව ව්‍යාපාරික ආයතනවල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, පිරිවැය අංග පාලනය කිරීම, තීරණ ගැනීම සහ කාර්යසාධන කළමනාකරණ පද්ධති පිළිබඳ දැනුවත්භාවය ලබා ගැනීමට අවස්ථාවන් ලබා දේ. තවද, පාඨමාලාව අවසානයේ දී, මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණයේ මෑත කාලීන ප්‍රවණතා අවධාරණය කෙරේ.

**BSE 2401:** **ආයතනික චර්යාව**

ආයතනික චර්යා අධ්‍යයනය මගින් කළමනාකරුවන්ට ආයතනවල පුද්ගලයින්ගේ සහ කණ්ඩායම්වල හැසිරීම තේරුම් ගැනීමට, පුරෝකථනය කිරීමට සහ බලපෑම් කිරීමට හැකියාව ලැබේ. එබැවින් මෙම පාඨමාලාව මඟින් පුද්ගල, කණ්ඩායම් සහ ආයතනික ක්‍රියාවලීන් අවබෝධ කර ගැනීමට සහ ඇගයීමට අවශ්‍ය දැනුම හා කුසලතා සිසුන්ට ලබා දේ. සංජානනය, අභිප්‍රේරණය, ඉගෙනීම, හැසිරීම් වෙනස් කිරීම, කණ්ඩායම් ගතිකතා, ආතතිය හා ගැටුම් කළමනාකරණය, නායකත්වය, සංවිධානාත්මක සංස්කෘතිය සහ ආයතනික වෙනස සහ සංවර්ධනය වැනි තේමාවන් සහ මාතෘකා යටතේ වැඩ කරන විට මිනිස් හැසිරීම් වලට අදාළ සංකල්ප, මූලධර්ම හා න්‍යායන් පුළුල් පරාසයක් ඉන් ආවරණය කරයි. සෑම මාතෘකාවක්ම තනි මට්ටමින් ආරම්භ කිරීමෙන් පසුව, කණ්ඩායම් මට්ටමට ගමන් කිරීමෙන් සහ අවසානයේ සංවිධාන මට්ටමින් පුළුල් විශ්ලේෂණයක් යොදා ගනිමින් පෙර මාතෘකා මත ගොඩනඟා ඇත. ආයතනික චර්යා ක්ෂේත්‍රයේ අඛණ්ඩව හා ඉදිරියට එන ප්‍රවණතා පිළිබඳව ද පාඨමාලාව අවධානය යොමු කරයි.

**BSE 2402:** **මානව සම්පත් කළමනාකරණය**

අනෙකුත් සම්පත් මගින් දේවල් කළ හැකි නමුත් මානව සම්පත් පමණක් දේවල් සිදුකරන බව මූලික සත්‍යයකි. එනිසා, මෙම පාඨමාලාව ව්‍යාපාර කළමනාකරණයේ ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රයක් වන සංවිධානවල මානව සම්පත් කළමනාකරණය පිළිබඳව වන අතර, එහි පරමාර්ථය වන්නේ මානව සම්පත් කළමනාකරණයේ (HRM) න්‍යායයන් සහ භාවිතයන් පිළිබඳ තාර්කික හා ක්‍රමානුකූල අවබෝධයක් ලබා දීමයි. පාඨමාලාවේ මාතෘකා අතරට මානව සම්පත් කළමනාකරණය, මානව සම්පත් දෙපාර්තමේන්තුව, රැකියා සැලසුම් කිරීම, රැකියා විශ්ලේෂණය, මානව සම්පත් සැලසුම් කිරීම, බඳවා ගැනීම, තෝරා ගැනීම, කුලියට ගැනීම, ප්‍රේරණය, කාර්යසාධනය ඇගයීම, පුහුණුව සහ සංවර්ධනය, ගෙවීම් කළමනාකරණය, දිරිගැන්වීම් කළමනාකරණය, සුභසාධන කළමනාකරණය, සේවක මාරුවීම් කළමනාකරණය, විනය කළමනාකරණය, දුක්ගැනවිලි කළමනාකරණය, සෞඛ්‍ය හා ආරක්ෂක පරිපාලනය සහ කම්කරු සබඳතා හඳුන්වාදීම ඇතුළත්ය. HRM හි නව දෘෂ්ටිකෝණයන් හා ප්‍රවේශයන් පිළිබඳව මූලික දැනුවත් කිරීමක් අපේක්ෂා කරන නමුත් කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරී ඉදිරි දර්ශනයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**BSE 2403:** **අලෙවිකරණ කළමනාකරණය**

අලෙවිකරණ කළමනාකරණය යනු ආයතනයක සමස්ත ව්‍යාපාරයේ කේන්ද්‍රීය අංගයක් වන අතර, එය පාරිභෝගික වටිනාකම නිර්මාණය කිරීම, සැලසුම් කිරීම, සැපයීම, සන්නිවේදනය කිරීම සහ පවත්වා ගැනීම සඳහා කාලය පුරාවට වෙනත් විෂයයන් සමඟ සම්මිශ්‍රණය කරමින් නිවැරදි අලෙවිකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. එබැවින්, ව්‍යාපාරයේ සාර්ථකත්වය බොහෝ විට අලෙවිකරණ හැකියාව මත රඳා පවතින අතර, අලෙවිකරුවන් ඉහළ ගතික ව්‍යාපාරික පරිසරයක් තුළ තරඟකාරී අභියෝගයන් හමුවේ නව අවස්ථා සහ විසඳුම් සොයා නිර්මාණය කිරීමට උත්සාහ කරයි. එමනිසා, මෙම පාඨමාලාව මඟින් ගතික ව්‍යාපාරික ලෝකයක අලෙවිකරණ කළමනාකරණයේ ප්‍රායෝගික යෙදුම් පිළිබඳව විශේෂ සඳහනක් සමඟ අලෙවිකරණ කළමනාකරණයේ ස්වභාවය සහ න්‍යායාත්මක පදනම් පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දේ. පාඨමාලාව මගින් මොඩියුල හතරක් ආවරණය කරයි: ඒවානම් අලෙවිකරණ කළමනාකරණය අවබෝධ කර ගැනීම සහ අලෙවිකරණ අවස්ථා විශ්ලේෂණය කිරීම, අලෙවිකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම, අලෙවිකරණ වැඩසටහන් සැලසුම් කිරීම සහ අලෙවිකරණ උත්සාහයන් කළමනාකරණය කිරීමයි. මෙම පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු, අලෙවිකරණ කළමනාකරණ විෂයෙහි භාවිතා වන ප්‍රධාන සංකල්ප, මූලධර්ම සහ ආකෘති අවබෝධ කර ගැනීමටත්, ගනුදෙනුකරුවන් සඳහා සුදුසු වටිනාකමක් තෝරා ගැනීමේ වැදගත්කම හඳුනා ගැනීමටත් සහ ගනුදෙනුකරුවන් ඉලක්ක කර ගැනීමට අපේක්ෂිත වටිනාකම ලබා දීමට හා සන්නිවේදනය කිරීමට ඵලදායී අලෙවිකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීමටත් සිසුන්ට හැකි විය යුතුය.

**BSE 2404: සංකාර්ය කළමනාකරණය**

මෙම පාඨමාලාව මෙහෙයුම් කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රධාන සංකල්ප, මූලධර්ම සහ සැලසුම් ශිල්පීය ක්‍රම පිළිබඳව සිසුන්ට හඳුන්වා දෙයි. සමාන්තර කළමනාකරණ ක්‍රියාකාරකම්, මෙහෙයුම් උපායමාර්ග හා තරඟකාරීත්වය, නිෂ්පාදන සැලසුම් කිරීම සහ ක්‍රියාවලි තෝරා ගැනීම, සමස්ත තත්ත්ව කළමනාකරණය, ධාරිතා කළමනාකරණය, පිරිසැකසුම සැලසුම් කිරීම - රැකියා සැලසුම, වැඩ මැනීම, සැපයුම් දාම කළමනාකරණය සහ තොග පාලනය සමඟ අන්තර්ක්‍රියා සහ සම්බන්ධතා සාකච්ඡා කිරීමෙන් සමස්තයක් ලෙස ක්ෂේත්‍රය පිළිබඳ පොදු අවබෝධයක් වර්ධනය කිරීම මෙහි අරමුණයි. නිෂ්පාදන හා සේවා සංවිධාන දෙකටම අනුව මෙම මෙහෙයුම් කටයුතු සාකච්ඡා කරනු ඇත.

**BSE 2405: ඵලදායිතාව සහ ගුණාත්මකභාවය සඳහා කළමනාකරණය**

සමකාලීන ව්‍යාපාරික සංවිධානයක් තුළ ඉහළ මට්ටමේ ඵලදායිතාව සහ ගුණාත්මකභාවය පවත්වා ගැනීම එහි සාර්ථකත්වයේ ප්‍රධාන සාධකයකි. මේ අනුව, ඵලදායිතාව සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ පුළුල් දැනුමක් අනාගත කළමනාකරුවන් සඳහා අත්‍යවශ්‍යය. සමකාලීන ව්‍යාපාරික සංවිධාන සඳහා සාර්ථකත්වයේ ප්‍රධාන කුළුණු ලෙස ඵලදායිතාව සහ තත්ත්වය පිළිබඳ විස්තීර්ණ දැනුම සහ ප්‍රායෝගික යොදා ගැනීමක් සිසුන්ට ලබාදීම මෙම පාඨමාලාවේ අරමුණ වේ. මෙම පාඨමාලාවෙන් ඵලදායිතාව සහ තත්ත්වය සහ විවිධ වර්ධන ක්‍රම, ශිල්ප ක්‍රම සහ ව්‍යවහාර සමඟ අඛණ්ඩව ඒවා වර්ධනය කරන ආකාරය පිළිබඳ ඒකාබද්ධ විස්තීර්ණ දැනුම ලබා දේ. පාඨමාලාව කොටස් දෙකක් තුළ එනම් ඵලදායිතා කළමනාකරණය සහ තත්ත්ව කළමනාකරණය ලෙස උගන්වනු ලැබේ.

**BSE 2406: මූල්‍ය කළමනාකරණය**

මෙම පාඨමාලාවෙන් මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රධාන සංකල්ප සහ ශිල්ප ක්‍රම පිළිබඳ හඳුන්වාදීමේ මට්ටමේ අවබෝධයක් ලබා දේ. පාඨමාලාවේ අන්තර්ගතයෙන් මූල්‍ය කළමනාකරණය, මූල්‍ය පරිසරය හඳුන්වාදීම, මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය සහ අර්ථකථනය, මුදලේ කාලීන අගය, මූල්‍ය ආරක්ෂාව ඇගයීම, අවදානම සහ ප්‍රතිඵල, ප්‍රාග්ධන පිරිවැය, ප්‍රාග්ධන අයවැයකරණය, ප්‍රාග්ධන ව්‍යුහය, ලාභාංශ ප්‍රතිපත්තිය සහ කාරක ප්‍රාග්ධන කළමනාකරණය ආවරණය කරයි.

**BSE 2407: ව්‍යාපාර තොරතුරු පද්ධති**

තොරතුරු පද්ධතිවල කාර්යභාරය සමකාලීන ආයතනවල රඳා පැවැත්ම සඳහා තීරණාත්මක වේ. එමනිසා, මෙම පාඨමාලාවෙන් සමකාලීන ආයතනවල භාවිතා කරන තොරතුරු පද්ධති පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබා දේ. ඉන් තොරතුරු පද්ධති සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ව්‍යාපාරික යොදා ගැනීම සහ ආයතන සහ ව්‍යාපාර කළමනාකරුවන් සඳහා ඒවායේ බලපෑම අවධාරණය කරයි. මෙම පාඨමාලාවෙන් වර්තමාන තාක්ෂණයෙන් පොහොසත් ආයතන සඳහා කාර්යසාධනය මෙහෙයවීම, ඉදිරියට ගෙන යාම සහ ප්‍රශස්ත කිරීමට ව්‍යාපාර කළමනාකරුවන් සඳහා අවශ්‍ය තාක්ෂණික, කළමනාකාරිත්ව සහ ආයතනික දැනුම පිළිබඳ විවිධත්වයක් ලබා දේ.

**BSE 2408 : ව්‍යවසායකත්වය**

අධ්‍යාපනික අවදානමක් හා බැඳුණු නිර්මාණශීලී සහ නව්‍යකරණ උත්සාහයන් තුළින් නව ව්‍යාපාර නිර්මාණය කිරීම සහ දැනට පවත්නා ව්‍යාපාර උසස් කිරීමේ ක්‍රියාවලිය හරහා සමාජ-ආර්ථික සංවර්ධනයට දායකත්වය සලකා බැලීමේදී ව්‍යවසායක්තවය ලොවපුරා අත්‍යවශ්‍යයෙන් වැදගත් බවට පත්ව ඇත. මේ අනුව, මෙම පාඨමාලාව රටේ අනාගත ව්‍යවසායකයින් සහ ව්‍යාපාර නායකයින් අතර ව්‍යවසායකත්වය පිළිබඳ ශක්තිමත් න්‍යායාත්මක පදනමක් සංවර්ධනය කිරීමට සැලසුම් කෙරේ. ඒ අනුව, මෙම පාඨමාලාවෙන් සිසුන් අතර අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප ඇතුළුව ව්‍යවසායකත්ව හැකියාවන් බෙදාදීමට අපේක්ෂා කෙරේ. ඒ තුළින් ව්‍යවසායකත්වයේ මූලිකාංග, ව්‍යවසායකත්වය

සහ අන්තර්ව්‍යවසායකත්වය අතර වෙනස සහ සම්බන්ධය, ව්‍යවසායන් තුළ නායකයින් ලෙස ඔවුන්ගේ කාර්යභාරය, ආර්ථිකය තුළ ව්‍යවසායකයින්ගේ කාර්යභාරය, ව්‍යවසායකත්ව වැඩවල නිර්මාණශීලිත්වය, සහ නවෝත්පාදනයන් හී වැදගත්කම, ව්‍යවසායකත්ව සමාගමක මූලික ව්‍යාපාර කාර්යයන්, මූලික ව්‍යාපාර සැලැස්මක මූලික අන්තර්ගතය සහ ව්‍යවසායකත්වයට අදාළ සමකාලීන ගැටළු සාකච්ඡා කරයි. එමනිසා, මෙම පාඨමාලාව ව්‍යවසායකයෙකු හෝ අන්තර්ව්‍යවසායකයෙකු ලෙස අවස්ථාවන් හඳුනා ගනිමින් සහ නව හෝ පවත්නා මානවකෘති සැලසුම් කිරීම හෝ නවීකරණය කිරීම තුළින් ඵලදායී කාර්යභාරයක් ඉටු කිරීමට ශිෂ්‍යයා පොළඹවනු ලබන අතර, අනෙකුත් සියලු සම්පත් ඒකාබද්ධ කර පුළුල් සමාජයට වටිනාකමක් එක් කරයි.

## BSE 3401: ව්‍යාපාර ආචාර ධර්ම සහ ආයතනික සමාජ වගකීම

ආචාර ධර්ම සහ ආයතනික සමාජ වගකීම් (CSR) යනු ගෝලීය ව්‍යාපාරික අධ්‍යාපනයේ මූලික විෂයයන් වේ. මේ අනුව, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිධාරීන්ට ආයතනවල අචාර ධර්ම ගැටලු මැඩ පැවැත්වීම සඳහා ව්‍යාපාරවල ආචාර ධර්ම හා ආයතනික සමාජ වගකීම් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබිය යුතුය. මෙම සන්දර්භය තුළ, මෙම පාඨමාලාව සමකාලීන සංවිධානවලට සහ ඒවායේ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වන ආචාර ධර්ම, විශේෂයෙන් ව්‍යාපාර ආචාර ධර්ම සහ ආයතනික සමාජ වගකීම් පිළිබඳ සිසුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට උත්සාහ කරයි. සමකාලීන සංවිධානවල ව්‍යාපාර ආචාර ධර්ම හා ආයතනික සමාජ වගකීම්වල වැදගත්කම අවධාරණය කරන අතරම, මෙම පාඨමාලාව මඟින් ආචාර ධර්ම හැසිරීම්වල කාර්යභාරය සහ සමාජ හා පාරිසරික වගකීම්වලට ආයතනය ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය සාකච්ඡා කරනු ඇත. තවද, ව්‍යාපාරික සංවිධානවලට ඔවුන්ගේ සමාජ බලපෑම සහ පාර්ශවකරුවන් සමඟ ඇති සබඳතා සදාචාරාත්මකව මෙන්ම ඵලදායී ලෙස කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පරීක්ෂා කරනු ඇත.

## BSE 3402: සංකාර්ය පර්යේෂණ

මෙම පාඨමාලාව මඟින් ආයතනවල වඩා හොඳ තීරණ ගැනීමට අත්‍යවශ්‍ය මෙහෙයුම් පර්යේෂණයේ ප්‍රධාන සංකල්ප, මූලධර්ම සහ ශිල්පීය ක්‍රම හඳුන්වා දෙනු ලැබේ. එනිසා, මෙම පාඨමාලාවේ මූලික පරමාර්ථය වන්නේ සැබෑ ලෝක කළමනාකරණ තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වන මෙහෙයුම් පර්යේෂණ (කළමනාකරණ විද්‍යාව) හි වැදගත් මාතෘකා සහ සංකල්ප පිළිබඳ සංකල්පීය හා ප්‍රායෝගික දැනුමක් සිසුන්ට ලබා දීමයි. එමනිසා, විසඳුම් ක්‍රියාපටිපාටිවල යාන්ත්‍ර විද්‍යාව කටපාඩම් කිරීම වෙනුවට මෙහෙයුම් පර්යේෂණ ක්‍රමවේදයන්ගේ සංකල්පීය අවබෝධය සහ ප්‍රායෝගික භාවිතය පිළිබඳව පාඨමාලාවෙන් අවධාරණය කරයි. පාඨමාලාවෙන් වැඩසටහන්කරණය, ප්‍රවාහන ආකෘතිය, පැවරුම් ආකෘතිය, ගතික වැඩසටහන් සහ ජාල විශ්ලේෂණයන් වැනි මෙහෙයුම් පර්යේෂණයේ ප්‍රධාන තේමාවන් සහ මාතෘකා ආවරණය කරයි.

## BSE 3403: ඩිජිටල් ව්‍යාපාරය

මෙම පාඨමාලාවේ අරමුණ සමකාලීන සංසිද්ධි දෙකක් වන ඊ-ව්‍යාපාර සහ ඊ-වාණිජ්‍ය කළමනාකරණය පිළිබඳ පුළුල් දැනුමක් ලබා දීමයි. හවුල්කරුවන් සහ ගනුදෙනුකරුවන් තුළින් යම් ආයතනයක් තුළ සහ ඉන් ඔබ්බට නව්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණය යෙදවීමෙන් ආයතනයක තරඟකාරිත්වය වැඩි දියුණු කරන්නේ කෙසේදැයි සිසුන් ඉගෙන ගනු ඇත. ආයතනයක සැපයුම් දාම කළමනාකරණයේ සියලු අංශ වැඩි දියුණු කිරීම සඳහා විද්‍යුත් සන්නිවේදනය භාවිත කළ හැකි ආකාරය පාඨමාලාවෙන් පැහැදිලි කෙරේ. තවද, පාඨමාලාවෙන් කළමනාකරුවන්ට තම සංවිධාන ඊ-ව්‍යාපාරයක් කරා ගෙන යාමට සහ ඊ-ව්‍යාපාර තුළින් සමෘද්ධිමත් වීමට අවශ්‍ය දැනුම හා කුසලතා පිළිබඳව අවධානය යොමු කෙරේ.

## BSE 3404: සංවර්ධන ආර්ථික විද්‍යාව

මෙම පාඨමාලාවේ මූලික පරමාර්ථය වනුයේ සංවර්ධන ආර්ථික විද්‍යාව සහ ශ්‍රී ලංකාව සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන ආර්ථික ගැටලු පිළිබඳ මූලික සංකල්ප පිළිබඳව සිසුන්ට පුළුල් දැනුමක් ලබා දීමයි. මෙම පාඨමාලාව ප්‍රධාන කොටස් හතරකින් සමන්විත වන අතර ඒවානම්, ආර්ථික වර්ධනය හා සංවර්ධනයේ න්‍යායන් සහ ආකෘති, සංවර්ධනය වෙමින් පවතින ජාතීන්ගේ ලක්ෂණ, දරිද්‍රතාව මැනීම, අසමානතාවය සහ මානව සංවර්ධනය සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන ගැටලු සහ අභියෝග වේ. පාඨමාලාව අවසානයේදී, ව්‍යාපාරික තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වන සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීමට සිසුන්ට හැකි වේ.

## BSE 3405: උපාය මාර්ගික කළමනාකරණය

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ ක්‍රමෝපායික කළමනාකරණ ක්‍රියාවලිය, සහ ඒ හා සම්බන්ධ ගැටලු, අදාළ සංකල්ප සහ ගතික හා තරඟකාරී ව්‍යාපාරික පරිසරයක් තුළ සංවිධාන කළමනාකරණය කිරීමේදී සිසුන්ගේ කුසලතා සහ හැකියාවන් වැඩි දියුණු කරන න්‍යායන් සහ මූලධර්ම පිළිබඳ පුළුල් අවබෝධයක් සිසුන්ට ලබා දීමයි. ඕනෑම ආයතනයක සේවය කරන සියලුම කළමනාකරුවන් සඳහා උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ දැනුම අවශ්‍ය වේ. ඉන් සංවිධාන පරිපූර්ණ ලෙස කළමනාකරණය කිරීම සඳහා සහ සාර්ථක උපාය මාර්ග ඵලදායී ලෙස සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය කිරීම සහ පාලනය කිරීම තුළින් තරඟකාරී වාසි ලබා ගැනීමට, රඳවා ගැනීමට සහ පවත්වා ගැනීමට එම සංවිධානවලට හැකි වන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීම සඳහා විවිධ ව්‍යාපාර කාර්යයන් සහ විෂයයන් පිළිබඳ දැනුම ඒකාබද්ධ කිරීම හා සංස්ලේෂණය කරයි.

## BSE 3406: සංවිධාන වෙනස හා සංවර්ධනය

වර්තමාන පරිසරය කැළඹිලි සහිත වන අතර එය සමඟ සාර්ථකව කටයුතු කිරීම සඳහා වෙනස සංවිධානාත්මක ජීවිතයේ නොවැළැක්විය හැකි ලක්ෂණය බවට පත්ව ඇත. ගෝලීයකරණය, තොරතුරු තාක්‍ෂණය සහ කළමනාකරණ නවෝත්පාදනයන් යනු සංවිධානටලට වෙනස්වීම සඳහා ඉල්ලීම් කරන ප්‍රධාන පාරිසරික වෙනස්කම් කිහිපයකි. මෙම පසුබිමට එරෙහිව, පැවැත්ම සහ වෙනස කළමනාකරණය කිරීම සමකාලීන වැඩ සංවිධානවල අත්‍යවශ්‍ය කළමනාකරණ කුසලතාවයක් බවට පත්වෙමින් පවතින අතර, වෙනස්වීම් මැදිහත්වීම් හඳුන්වා දීම සඳහා සංවිධානවලට මඟ පෙන්වීමේදී සංවිධාන සංවර්ධනය (OD) වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සංවිධාන සංවර්ධනය මඟින් ආයතනික ඵලදායීතාවය ඉහළ නැංවීම සහ ආයතනික උපායමාර්ග, ව්‍යුහයන් සහ ක්‍රියාවලීන් සඳහා සැලසුම් සහගත මැදිහත්වීම් ලෙස වෙනස හඳුන්වා දීම සඳහා චර්යාත්මක විද්‍යා දැනුම භාවිතයේ යෙදවීම අරමුණු කරයි. මෙම පාඨමාලාව සැලසුම් සහගත වෙනස් කිරීමේ උත්සාහයන් තුළින් ආයතනික ඵලදායීතාවය ඉහළ නැංවීමට උත්සාහ කරන ප්‍රවේශයක් පිළිබඳ අවබෝධයක් වර්ධනය කිරීම සඳහා සංවිධාන සංවර්ධනයෙහි න්‍යායාත්මක යටි අරමුණු ලබා දීමට දරන උත්සාහයකි.

## BSE 3407: ජාත්‍යන්තර ව්‍යාපාර කළමනාකරණය

වර්තමාන අන්‍යෝන්‍ය පරායත්ත ගෝලීය සන්දර්භය තුළ, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධි අපේක්ෂකයින් සඳහා අන්තර්ජාතික ව්‍යාපාර පිළිබඳ අවබෝධය අත්‍යවශ්‍ය වේ. මේ අනුව, මෙම පාඨමාලාව සමකාලීන ව්‍යාපාරික සංවිධාන ක්‍රියාත්මක වන ගෝලීය ආර්ථික, දේශපාලන, සමාජ හා සංස්කෘතික වාතාවරණය අවබෝධකර ගැනීම සඳහා අත්‍යවශ්‍ය දැනුම, කුසලතා සහ හැකියාවන් බෙදා හැරීම සඳහා නිර්මාණය කර ඇත. මෙම පාඨමාලාව මගින් අන්තර්ජාතික සමාගම්වල ආයතනික හා ව්‍යාපාරික මට්ටමේ උපාය මාර්ග පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමටත්, සමාගම් කෙරෙහි රජයේ මැදිහත්වීමේ බලපෑම තක්සේරු කිරීමටත් පහසුකම් සැලසේ. එමනිසා, පාඨමාලාව මඟින් තම

සමාගම්වලට ජාත්‍යන්තර සන්දර්භය තුළ ක්‍රියාත්මක වීමට හා සාර්ථක වීමට හැකි උපාය මාර්ග අවබෝධ කර ගැනීමට, සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සිසුන් සූදානම් කිරීම අපේක්ෂා කරයි.

### BSE 3408: මානව සම්පත් සංවර්ධනය

තරඟකාරී ව්‍යාපාරික පරිසරයක් තුළ නොනැසී පැවතීමට සහ ශක්තිමත්වීම සඳහා, ආයතනයක සේවකයින් එහි තරඟකරුවන්ට වඩා වේගයෙන් හා නිර්මාණශීලීව ඉගෙනීම අවශ්‍ය වන අතර ඵලදායී මානව සම්පත් සංවර්ධන (HRD) උපාය මාර්ග තුළින් මෙය සාර්ථකව සාක්ෂාත් කරගත හැකිය. මානව සම්පත් සංවර්ධනය යනු ආයතන ඵලදායී කිරීම මගින් සංවිධානවල සේවකයින්ගේ වර්ධනයට හා සංවර්ධනයට ක්‍රමානුකූලව මඟ පෙන්වන ප්‍රධාන කාර්යයකි. මෙම පසුබිම තුළ, මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ සිසුන්ගේ චිත්තාපර හැකියාවන් සංවර්ධනය කිරීමට ඔවුන් සන්නද්ධ කිරීමයි. එමනිසා, මෙම පාඨමාලාවේ මූලික පරමාර්ථය වනුයේ සංවිධානයේ අරමුණු වලට සමගාමීව සුදුසු මානව සම්පත් සංවර්ධන උපාය මාර්ග සංවර්ධනය කිරීමට සිසුන්ට හැකි වන පරිදි ආයතනයක් තුළ මානව සම්පත් සංවර්ධනයේ කාර්යභාරය පැහැදිලි කිරීම සහ නිරූපණය කිරීමයි. එනිසා, මෙම පාඨමාලාවට මානව සම්පත්  සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීමට අදාළ මාතෘකා ඇතුළත් වේ. තවද, ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික සංවිධාන වෙත විශේෂ අවධානයක් යොමු කරමින් කළමනාකරණ සංවර්ධනය, පුහුණු කිරීම සහ උපදේශනය, වෘත්තීය සැලසුම්කරණය සහ සංවර්ධනය සහ කුසලතා කළමනාකරණය වැනි විවිධ මානව සම්පත්  සංවර්ධන මැදිහත්වීම් සහ තේමාවන් ඉන් ආවරණය කරයි.

**විමසීම්**
**බාහිර උපාධි පාඨමාලා සමායෝජක - මහාචාර්ය ජී.ඩී.වී.ආර්. සේනාධීර මහත්මිය**
ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ, 10250, ශ්‍රී ලංකාව.
**දුරකතන:** +94 (0)112 803472/0750103479
**Web:** https://mgt.sjp.ac.lk/bus/
**Email:** rupika@sjp.ac.lk

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
දු.ක.: +940112801481/ +940113132496
වෙබ් අඩවිය: external.sjp.ac.lk

ISSN 3021-6508
9 773021 650004